# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2018

# ඇගයීම් වාර්තාව

# 33 - ඉතිහාසය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018

## ඇගයීම් වාර්තාව

# 33 - ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ඉතිහාසය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ඉතිහාසය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණුදීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2019 දෙසැම්බර් 30
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | **:** | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | **:** | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | **:** | එස්. ප්‍රනවදාසන්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - පාසල් විභාග) |
| **විෂය සම්බන්ධීකරණය** | : | ඩී.ආර්.එන්.කේ. ගමගේ<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | **:** | මහාචාර්ය ඉන්ද්‍රානී මුණසිංහ මිය<br>සේවා සම්මානිත මහාචාර්ය (ඉතිහාසය)<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>ආර්.ඒ. චන්ද්‍රසිරි (විශ්‍රාමික)<br>කලාප අධ්‍යාපන කාර්යාලය, මිනුවන්ගොඩ |
| **සැකසුම් කමිටුව** | : | එච්. අරුණ ඉන්ද්‍රසේන<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>බලංගොඩ<br><br>එච්.එම්.එස්.එන්. හේරත්<br>ගුරු සේවය<br>ව/ගිරි/ අයිරා අමරසේකර මහ විද්‍යාලය<br>පැන්තැනිගොඩ<br>නාරම්මල<br><br>අයි.ඩී. ජේ.පී. ඉද්දමල්ගොඩ<br>ගුරු සේවය<br>ර/ පත්බේරිය නාරද මධ්‍ය මහ විද්‍යාලය<br>පත්බේරිය, පරකඩුව<br><br>ජී.ඩබ්. නිමලාවතී<br>ගුරු සේවය<br>මාර/ මාරඹ මහා විද්‍යාලය<br>මාරඹ, අකුරැස්ස<br><br>කේ.කේ. කුසුමලතා<br>ගුරු සේවය<br>මාර/ යටියන මහ විද්‍යාලය<br>යටියන, මාතර<br><br>එම්. චන්ද්‍රාවතී<br>ගුරු සේවය<br>ර/ ශාන්ත ඇලෝසියස් ජාතික පාසල<br>රත්නපුරය |
| **පරිගණක පිටපත සැකසුම** | **:** | පී. මධුශානී මණ්ඩලවත්ත<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු<br><br>ආර්.ඒ.එන්.එම්. පෙරේරා<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I පත්‍රය සඳහා සාධනය 8

1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9

1.3.3 II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9

1.3.4 II පත්‍රය සඳහා සාධනය 10

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I පත්‍රයේ ව්‍යුහය 13

2.1.2 I පත්‍රය 14

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18

2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 19

2.1.5 I පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 21

2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 22

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II පත්‍රයේ ව්‍යුහය 23

2.2.2 II පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 24

2.2.3 II පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 48

## III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 51

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 53

## I කොටස

# 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 ඉතිහාසය විෂයයෙහි අභිමතාර්ථ

- ★ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විමර්ශනයෙහි යෙදෙයි.
- ★ වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ විමර්ශනාත්මක දැනුම උපයෝගී කර ගනියි.
- ★ ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව විමසා බලමින් කටයුතු කරයි.
- ★ වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ★ ජාතික අනන්‍යතාව හඳුනාගෙන ඒවා අගය කරමින් චරිතායනය කරයි.
- ★ ඉතිහාසයේ අත්දැකීම් වර්තමාන සංසිද්ධි සඳහා ඵලදායි ලෙස භාවිත කරයි.
- ★ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධති පිළිබඳ අභිමානවත් හැඟුමින් යුක්තව කටයුතු කරයි.
- ★ විචාරශීලී හා විවේචනාත්මක චින්තන සංකල්ප වර්ධනය කර ගනියි.
- ★ ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනාගැනීමේ හැකියාව දියුණු කරයි.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 240366 | 4172 | 244538 |
| දෙමළ | 69447 | 9877 | 79324 |
| ඉංග්‍රීසි | 575 | 5597 | 6172 |
| **එකතුව** | **310388** | **19646** | **330034** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 52169 | 16.81 | 702 | 3.57 | 52871 | 16.02 |
| B | 37206 | 11.99 | 804 | 4.09 | 38010 | 11.52 |
| C | 85144 | 27.43 | 3334 | 16.97 | 88478 | 26.81 |
| S | 80749 | 26.01 | 6675 | 33.98 | 87424 | 26.49 |
| W | 55120 | 17.76 | 8131 | 41.39 | 63251 | 19.16 |
| **එකතුව** | **310388** | **100.00** | **19646** | **100.00** | **330034** | **100.00** |

වගුව 2

## 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 32684 | 8930 | 27.32 | 4570 | 13.98 | 8433 | 25.80 | 6266 | 19.17 | 28199 | 86.28 | 4485 | 13.72 |
| 2. ගම්පහ | 28371 | 5987 | 21.10 | 3629 | 12.79 | 7541 | 26.58 | 6510 | 22.95 | 23667 | 83.42 | 4704 | 16.58 |
| 3. කළුතර | 17013 | 3533 | 20.77 | 2220 | 13.05 | 4560 | 26.80 | 3876 | 22.78 | 14189 | 83.40 | 2824 | 16.60 |
| 4. මහනුවර | 21412 | 3847 | 17.97 | 2661 | 12.43 | 6119 | 28.58 | 5290 | 24.71 | 17917 | 83.68 | 3495 | 16.32 |
| 5. මාතලේ | 7248 | 1057 | 14.58 | 828 | 11.42 | 2042 | 28.17 | 2017 | 27.83 | 5944 | 82.01 | 1304 | 17.99 |
| 6. නුවරඑළිය | 10957 | 1083 | 9.88 | 1109 | 10.12 | 3043 | 27.77 | 3194 | 29.15 | 8429 | 76.93 | 2528 | 23.07 |
| 7. ගාල්ල | 15563 | 3111 | 19.99 | 2141 | 13.76 | 4550 | 29.24 | 3681 | 23.65 | 13483 | 86.63 | 2080 | 13.37 |
| 8. මාතර | 12036 | 2524 | 20.97 | 1795 | 14.91 | 3677 | 30.55 | 2732 | 22.70 | 10728 | 89.13 | 1308 | 10.87 |
| 9. හම්බන්තොට | 9121 | 1591 | 17.44 | 1279 | 14.02 | 2907 | 31.87 | 2261 | 24.79 | 8038 | 88.13 | 1083 | 11.87 |
| 10. යාපනය | 8490 | 1203 | 14.17 | 895 | 10.54 | 1965 | 23.14 | 2123 | 25.01 | 6186 | 72.86 | 2304 | 27.14 |
| 11. කිලිනොච්චි | 2157 | 156 | 7.23 | 152 | 7.05 | 464 | 21.51 | 596 | 27.63 | 1368 | 63.42 | 789 | 36.58 |
| 12. මන්නාරම | 1546 | 153 | 9.90 | 164 | 10.61 | 459 | 29.69 | 474 | 30.66 | 1250 | 80.85 | 296 | 19.15 |
| 13. වව්නියාව | 2542 | 292 | 11.49 | 277 | 10.90 | 691 | 27.18 | 722 | 28.40 | 1982 | 77.97 | 560 | 22.03 |
| 14. මුලතිව් | 1836 | 144 | 7.84 | 163 | 8.88 | 416 | 22.66 | 496 | 27.02 | 1219 | 66.39 | 617 | 33.61 |
| 15. මඩකලපුව | 8131 | 735 | 9.04 | 767 | 9.43 | 2068 | 25.43 | 2530 | 31.12 | 6100 | 75.02 | 2031 | 24.98 |
| 16. අම්පාර | 9951 | 1171 | 11.77 | 1196 | 12.02 | 2953 | 29.68 | 2895 | 29.09 | 8215 | 82.55 | 1736 | 17.45 |
| 17. ත්‍රිකුණාමලය | 5902 | 479 | 8.12 | 567 | 9.61 | 1579 | 26.75 | 1825 | 30.92 | 4450 | 75.40 | 1452 | 24.60 |
| 18. කුරුණෑගල | 23866 | 4513 | 18.91 | 3307 | 13.86 | 7388 | 30.96 | 5774 | 24.19 | 20982 | 87.92 | 2884 | 12.08 |
| 19. පුත්තලම | 10777 | 1287 | 11.94 | 1161 | 10.77 | 2968 | 27.54 | 3131 | 29.05 | 8547 | 79.31 | 2230 | 20.69 |
| 20. අනුරාධපුරය | 13527 | 1884 | 13.93 | 1720 | 12.72 | 4120 | 30.46 | 3641 | 26.92 | 11365 | 84.02 | 2162 | 15.98 |
| 21. පොළොන්නරුව | 5887 | 723 | 12.28 | 662 | 11.25 | 1835 | 31.17 | 1568 | 26.63 | 4788 | 81.33 | 1099 | 18.67 |
| 22. බදුල්ල | 12771 | 1804 | 14.13 | 1543 | 12.08 | 3842 | 30.08 | 3427 | 26.83 | 10616 | 83.13 | 2155 | 16.87 |
| 23. මොනරාගල | 6910 | 868 | 12.56 | 807 | 11.68 | 2060 | 29.81 | 1852 | 26.80 | 5587 | 80.85 | 1323 | 19.15 |
| 24. රත්නපුරය | 15226 | 2794 | 18.35 | 1840 | 12.08 | 4199 | 27.58 | 3798 | 24.94 | 12631 | 82.96 | 2595 | 17.04 |
| 25. කෑගල්ල | 12067 | 2265 | 18.77 | 1633 | 13.53 | 3404 | 28.21 | 3022 | 25.04 | 10324 | 85.56 | 1743 | 14.44 |
| **සමස්ත දිවයින** | **295991** | **52134** | **17.61** | **37086** | **12.53** | **83283** | **28.14** | **73701** | **24.90** | **246204** | **83.18** | **49787** | **16.82** |

වගුව 3

## 1.2.4 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 14510 | 4755 | 32.77 | 2011 | 13.86 | 3351 | 23.09 | 2381 | 16.41 | 12498 | 86.13 | 2012 | 13.87 |
| 2. හෝමාගම | 4718 | 1105 | 23.42 | 651 | 13.80 | 1213 | 25.71 | 1002 | 21.24 | 3971 | 84.17 | 747 | 15.83 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 7619 | 1918 | 25.17 | 1113 | 14.61 | 2219 | 29.12 | 1528 | 20.06 | 6778 | 88.96 | 841 | 11.04 |
| 4. පිළියන්දල | 5837 | 1152 | 19.74 | 795 | 13.62 | 1650 | 28.27 | 1355 | 23.21 | 4952 | 84.84 | 885 | 15.16 |
| 5. ගම්පහ | 8228 | 2356 | 28.63 | 1120 | 13.61 | 1960 | 23.82 | 1663 | 20.21 | 7099 | 86.28 | 1129 | 13.72 |
| 6 මිනුවන්ගොඩ | 5365 | 986 | 18.38 | 695 | 12.95 | 1462 | 27.25 | 1336 | 24.90 | 4479 | 83.49 | 886 | 16.51 |
| 7. මීගමුව | 7346 | 1154 | 15.71 | 857 | 11.67 | 1958 | 26.65 | 1824 | 24.83 | 5793 | 78.86 | 1553 | 21.14 |
| 8. කැලණිය | 7432 | 1491 | 20.06 | 957 | 12.88 | 2161 | 29.08 | 1687 | 22.70 | 6296 | 84.71 | 1136 | 15.29 |
| 9. කළුතර | 8508 | 1596 | 18.76 | 1066 | 12.53 | 2265 | 26.62 | 2038 | 23.95 | 6965 | 81.86 | 1543 | 18.14 |
| 10. මතුගම | 3351 | 818 | 24.41 | 480 | 14.32 | 936 | 27.93 | 664 | 19.81 | 2898 | 86.48 | 453 | 13.52 |
| 11. හොරණ | 5154 | 1119 | 21.71 | 674 | 13.08 | 1359 | 26.37 | 1174 | 22.78 | 4326 | 83.93 | 828 | 16.07 |
| 12. මහනුවර | 7603 | 2438 | 32.07 | 1213 | 15.95 | 1939 | 25.50 | 1302 | 17.12 | 6892 | 90.65 | 711 | 9.35 |
| 13. දෙනුවර | 2276 | 198 | 8.70 | 241 | 10.59 | 701 | 30.80 | 705 | 30.98 | 1845 | 81.06 | 431 | 18.94 |
| 14. ගම්පොල | 3643 | 456 | 12.52 | 385 | 10.57 | 987 | 27.09 | 986 | 27.07 | 2814 | 77.24 | 829 | 22.76 |
| 15. තෙල්දෙණිය | 1873 | 129 | 6.89 | 170 | 9.08 | 600 | 32.03 | 569 | 30.38 | 1468 | 78.38 | 405 | 21.62 |
| 16. වත්තේගම | 2833 | 252 | 8.90 | 272 | 9.60 | 887 | 31.31 | 818 | 28.87 | 2229 | 78.68 | 604 | 21.32 |
| 17. කටුගස්තොට | 3184 | 374 | 11.75 | 380 | 11.93 | 1005 | 31.56 | 910 | 28.58 | 2669 | 83.83 | 515 | 16.17 |
| 18. මාතලේ | 3973 | 799 | 20.11 | 493 | 12.41 | 1065 | 26.81 | 1014 | 25.52 | 3371 | 84.85 | 602 | 15.15 |
| 19. ගලේවෙල | 2222 | 163 | 7.34 | 223 | 10.04 | 665 | 29.93 | 687 | 30.92 | 1738 | 78.22 | 484 | 21.78 |
| 20. නාඋල | 521 | 49 | 9.40 | 55 | 10.56 | 139 | 26.68 | 164 | 31.48 | 407 | 78.12 | 114 | 21.88 |
| 21. විල්ගමුව | 532 | 46 | 8.65 | 57 | 10.71 | 173 | 32.52 | 152 | 28.57 | 428 | 80.45 | 104 | 19.55 |
| 22. නුවරඑළිය | 3130 | 216 | 7.08 | 260 | 8.52 | 823 | 26.97 | 930 | 30.48 | 2229 | 73.06 | 822 | 26.94 |
| 23. කොත්මලේ | 1462 | 166 | 11.16 | 182 | 12.23 | 450 | 30.24 | 397 | 26.68 | 1195 | 80.31 | 293 | 19.69 |
| 24. හැටන් | 3116 | 350 | 11.04 | 321 | 10.13 | 865 | 27.30 | 930 | 29.35 | 2466 | 77.82 | 703 | 22.18 |
| 25. වලපනේ | 1482 | 105 | 7.09 | 134 | 9.04 | 431 | 29.08 | 459 | 30.97 | 1129 | 76.18 | 353 | 23.82 |
| 26. හඟුරන්කෙත | 1767 | 246 | 13.92 | 212 | 12.00 | 474 | 26.83 | 478 | 27.05 | 1410 | 79.80 | 357 | 20.20 |
| 27. ගාල්ල | 7246 | 1898 | 26.19 | 1005 | 13.87 | 1950 | 26.91 | 1526 | 21.06 | 6379 | 88.03 | 867 | 11.97 |
| 28. ඇල්පිටිය | 3160 | 326 | 10.32 | 391 | 12.37 | 1062 | 33.61 | 902 | 28.54 | 2681 | 84.84 | 479 | 15.16 |
| 29. අම්බලන්ගොඩ | 3349 | 662 | 19.77 | 486 | 14.51 | 964 | 28.78 | 755 | 22.54 | 2867 | 85.61 | 482 | 14.39 |
| 30. උඩුගම | 1808 | 225 | 12.44 | 259 | 14.33 | 574 | 31.75 | 498 | 27.54 | 1556 | 86.06 | 252 | 13.94 |
| 31. මාතර | 5493 | 1543 | 28.09 | 882 | 16.06 | 1589 | 28.93 | 1001 | 18.22 | 5015 | 91.30 | 478 | 8.70 |
| 32. අකුරැස්ස | 2074 | 385 | 18.56 | 257 | 12.39 | 608 | 29.32 | 554 | 26.71 | 1804 | 86.98 | 270 | 13.02 |
| 33. මුලටියන-හක්මණ | 2199 | 288 | 13.10 | 363 | 16.51 | 735 | 33.42 | 545 | 24.78 | 1931 | 87.81 | 268 | 12.19 |
| 34. මොරවක-දෙනියාය | 2270 | 308 | 13.57 | 293 | 12.91 | 745 | 32.82 | 632 | 27.84 | 1978 | 87.14 | 292 | 12.86 |
| 35. තංගල්ල | 2554 | 460 | 18.01 | 372 | 14.57 | 839 | 32.85 | 577 | 22.59 | 2248 | 88.02 | 306 | 11.98 |
| 36. හම්බන්තොට | 3998 | 520 | 13.04 | 483 | 12.11 | 1219 | 30.56 | 1148 | 28.78 | 3370 | 84.48 | 619 | 15.52 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 37. වලස්මුල්ල | 2578 | 611 | 23.70 | 424 | 16.45 | 849 | 32.93 | 536 | 20.79 | 2420 | 93.87 | 158 | 6.13 |
| 38. යාපනය | 3087 | 600 | 19.60 | 399 | 13.03 | 748 | 24.44 | 677 | 22.12 | 2424 | 79.19 | 637 | 20.81 |
| 39. දූපත් | 614 | 39 | 6.35 | 36 | 5.86 | 136 | 22.15 | 176 | 28.66 | 387 | 63.03 | 227 | 36.97 |
| 40. තෙන්මාරච්චි | 883 | 105 | 11.78 | 78 | 8.75 | 183 | 20.54 | 228 | 25.59 | 594 | 66.67 | 297 | 33.33 |
| 41. වලිකාමන් | 2491 | 265 | 10.58 | 225 | 8.98 | 515 | 20.56 | 704 | 28.10 | 1709 | 68.22 | 796 | 31.78 |
| 42. වඩමරච්චි | 1415 | 194 | 13.67 | 157 | 11.06 | 383 | 26.99 | 338 | 23.82 | 1072 | 75.55 | 347 | 24.45 |
| 43. කිලිනොච්චි | 2157 | 156 | 7.23 | 152 | 7.05 | 464 | 21.51 | 596 | 27.63 | 1368 | 63.42 | 789 | 36.58 |
| 44. මන්නාරම | 1256 | 140 | 11.80 | 140 | 11.80 | 341 | 28.75 | 341 | 28.75 | 962 | 81.11 | 224 | 18.89 |
| 45. මඩු | 360 | 13 | 3.61 | 24 | 6.67 | 118 | 32.78 | 133 | 36.94 | 288 | 80.00 | 72 | 20.00 |
| 46. වව්නියාව දකුණ | 2009 | 264 | 13.28 | 216 | 10.87 | 555 | 27.92 | 525 | 26.41 | 1560 | 78.47 | 428 | 21.53 |
| 47. වව්නියාව උතුර | 548 | 28 | 5.05 | 61 | 11.01 | 136 | 24.55 | 197 | 35.56 | 422 | 76.17 | 132 | 23.83 |
| 48. මුලතිව් | 1255 | 111 | 8.82 | 123 | 9.78 | 309 | 24.56 | 338 | 26.87 | 881 | 70.03 | 377 | 29.97 |
| 49. තුනුක්කායි | 578 | 33 | 5.71 | 40 | 6.92 | 107 | 18.51 | 158 | 27.34 | 338 | 58.48 | 240 | 41.52 |
| 50. මඩකලපුව | 2323 | 236 | 10.61 | 236 | 10.61 | 554 | 24.91 | 627 | 28.19 | 1653 | 74.33 | 571 | 25.67 |
| 51. කල්කුඩා | 1331 | 90 | 6.54 | 81 | 5.89 | 329 | 23.91 | 496 | 36.05 | 996 | 72.38 | 380 | 27.62 |
| 52. පදිරිප්පු | 1437 | 119 | 7.84 | 138 | 9.09 | 377 | 24.84 | 483 | 31.82 | 1117 | 73.58 | 401 | 26.42 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 1952 | 253 | 12.96 | 243 | 12.45 | 539 | 27.61 | 525 | 26.90 | 1560 | 79.92 | 392 | 20.08 |
| 54. මඩකලපුව (බටහිර) | 1047 | 37 | 3.49 | 69 | 6.50 | 269 | 25.35 | 399 | 37.61 | 774 | 72.95 | 287 | 27.05 |
| 55. අම්පාර | 2525 | 337 | 13.46 | 332 | 13.26 | 784 | 31.31 | 649 | 25.92 | 2102 | 83.95 | 402 | 16.05 |
| 56. කල්මුනේ | 2386 | 361 | 15.78 | 308 | 13.46 | 657 | 28.72 | 645 | 28.19 | 1971 | 86.15 | 317 | 13.85 |
| 57. සමන්තුරෙයි | 1377 | 110 | 7.94 | 137 | 9.89 | 356 | 25.70 | 439 | 31.70 | 1042 | 75.23 | 343 | 24.77 |
| 58. මහඔය | 606 | 32 | 5.28 | 61 | 10.07 | 193 | 31.85 | 181 | 29.87 | 467 | 77.06 | 139 | 22.94 |
| 59. දෙහිඅත්තකණ්ඩිය | 1008 | 104 | 10.83 | 105 | 10.94 | 284 | 29.58 | 311 | 32.40 | 804 | 83.75 | 156 | 16.25 |
| 60. අක්කරෙයිපත්තුව | 1258 | 165 | 11.60 | 195 | 13.71 | 495 | 34.81 | 405 | 28.48 | 1260 | 88.61 | 162 | 11.39 |
| 61. තිරුක්කෝවිල් | 860 | 62 | 7.89 | 58 | 7.38 | 184 | 23.41 | 265 | 33.72 | 569 | 72.39 | 217 | 27.61 |
| 62. ත්‍රිකුණාමලය | 1723 | 206 | 10.10 | 202 | 9.90 | 548 | 26.86 | 626 | 30.69 | 1582 | 77.55 | 458 | 22.45 |
| 63. මුතූර් | 1285 | 89 | 8.26 | 116 | 10.77 | 353 | 32.78 | 320 | 29.71 | 878 | 81.52 | 199 | 18.48 |
| 64. කන්තලේ | 974 | 70 | 6.97 | 103 | 10.26 | 276 | 27.49 | 342 | 34.06 | 791 | 78.78 | 213 | 21.22 |
| 65. කින්නියා | 1332 | 99 | 7.11 | 123 | 8.83 | 314 | 22.54 | 425 | 30.51 | 961 | 68.99 | 432 | 31.01 |
| 66. ත්‍රිකුණාමලය (උතුර) | 591 | 15 | 3.87 | 23 | 5.93 | 88 | 22.68 | 112 | 28.87 | 238 | 61.34 | 150 | 38.66 |
| 67. කුරුණෑගල | 5947 | 1648 | 27.71 | 879 | 14.78 | 1639 | 27.56 | 1207 | 20.30 | 5373 | 90.35 | 574 | 9.65 |
| 68. කුලියාපිටිය | 4112 | 877 | 21.33 | 559 | 13.59 | 1200 | 29.18 | 977 | 23.76 | 3613 | 87.86 | 499 | 12.14 |
| 69. නිකවැරටිය | 2960 | 435 | 14.70 | 431 | 14.56 | 1018 | 34.39 | 784 | 26.49 | 2668 | 90.14 | 292 | 9.86 |
| 70. මහව | 3816 | 401 | 10.51 | 476 | 12.47 | 1323 | 34.67 | 1085 | 28.43 | 3285 | 86.08 | 531 | 13.92 |
| 71. ගිරිඋල්ල | 3923 | 681 | 17.36 | 575 | 14.66 | 1213 | 30.92 | 909 | 23.17 | 3378 | 86.11 | 545 | 13.89 |
| 72. ඉබ්බාගමුව | 3108 | 471 | 15.15 | 387 | 12.45 | 995 | 32.01 | 812 | 26.13 | 2665 | 85.75 | 443 | 14.25 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 73. පුත්තලම | 5057 | 417 | 8.07 | 446 | 8.63 | 134\2 | 25.97 | 1676 | 32.43 | 3881 | 75.10 | 1287 | 24.90 |
| 74. හලාවත | 5635 | 870 | 15.51 | 715 | 12.75 | 1626 | 28.99 | 1455 | 25.94 | 4666 | 83.19 | 943 | 16.81 |
| 75. අනුරාධපුරය | 4824 | 945 | 19.93 | 666 | 14.05 | 1340 | 28.26 | 1119 | 23.60 | 4070 | 85.85 | 671 | 14.15 |
| 76. තඹුත්තේගම | 2445 | 255 | 10.67 | 310 | 12.97 | 700 | 29.29 | 665 | 27.82 | 1930 | 80.75 | 460 | 19.25 |
| 77. කැකිරාව | 2615 | 404 | 14.80 | 306 | 11.21 | 785 | 28.77 | 743 | 27.23 | 2238 | 82.01 | 491 | 17.99 |
| 78. ගලෙන්බිඳුනුවැව | 1678 | 104 | 6.19 | 213 | 12.67 | 617 | 36.70 | 524 | 31.17 | 1458 | 86.73 | 223 | 13.27 |
| 79. කැබිතිගොල්ලෑව | 1965 | 176 | 8.86 | 225 | 11.33 | 678 | 34.14 | 590 | 29.71 | 1669 | 84.04 | 317 | 15.96 |
| 80. පොළොන්නරුව | 1917 | 293 | 15.28 | 261 | 13.62 | 599 | 31.25 | 459 | 23.94 | 1612 | 84.09 | 305 | 15.91 |
| 81. හිඟුරක්ගොඩ | 2469 | 345 | 13.97 | 282 | 11.42 | 767 | 31.07 | 625 | 25.31 | 2019 | 81.77 | 450 | 18.23 |
| 82. දිඹුලාගල | 1473 | 85 | 5.66 | 119 | 7.93 | 469 | 31.25 | 484 | 32.25 | 1157 | 77.08 | 344 | 22.92 |
| 83. බදුල්ල | 2769 | 545 | 19.68 | 344 | 12.42 | 811 | 29.29 | 653 | 23.58 | 2353 | 84.98 | 416 | 15.02 |
| 84. බණ්ඩාරවෙල | 3337 | 618 | 18.52 | 441 | 13.22 | 947 | 28.38 | 828 | 24.81 | 2834 | 84.93 | 503 | 15.07 |
| 85. මහියංගනය | 1962 | 191 | 9.73 | 193 | 9.84 | 564 | 28.75 | 591 | 30.12 | 1539 | 78.44 | 423 | 21.56 |
| 86. වැලිමඩ | 2725 | 305 | 11.19 | 364 | 13.36 | 899 | 32.99 | 736 | 27.01 | 2304 | 84.55 | 421 | 15.45 |
| 87. පස්සර | 1081 | 84 | 7.77 | 119 | 11.01 | 298 | 27.57 | 339 | 31.36 | 840 | 77.71 | 241 | 22.29 |
| 88. වියළුව | 897 | 61 | 6.80 | 82 | 9.14 | 323 | 36.01 | 280 | 31.22 | 746 | 83.17 | 151 | 16.83 |
| 89. මොනරාගල | 2198 | 260 | 11.83 | 265 | 12.06 | 663 | 30.16 | 599 | 27.25 | 1787 | 81.30 | 411 | 18.70 |
| 90. වැල්ලවාය | 1763 | 217 | 12.25 | 193 | 10.89 | 514 | 29.01 | 486 | 27.43 | 1410 | 79.57 | 362 | 20.43 |
| 91. බිබිල | 1639 | 270 | 16.47 | 205 | 12.51 | 495 | 30.20 | 393 | 23.98 | 1363 | 83.16 | 276 | 16.84 |
| 92. තණමල්විල | 1301 | 121 | 9.30 | 144 | 11.07 | 388 | 29.82 | 374 | 28.75 | 1027 | 78.94 | 274 | 21.06 |
| 93. රත්නපුර | 6291 | 1527 | 24.31 | 768 | 12.23 | 1605 | 25.55 | 1378 | 21.94 | 5278 | 84.02 | 1004 | 15.98 |
| 94. බළන්ගොඩ | 2721 | 436 | 15.97 | 341 | 12.49 | 786 | 28.79 | 705 | 25.82 | 2268 | 83.08 | 462 | 16.92 |
| 95. නිවිතිගල | 2370 | 240 | 10.13 | 260 | 10.97 | 693 | 29.24 | 685 | 28.90 | 1878 | 79.24 | 492 | 20.76 |
| 96. ඇඹිලිපිටිය | 3844 | 591 | 15.37 | 471 | 12.25 | 1115 | 29.01 | 1030 | 26.80 | 3207 | 83.43 | 637 | 16.57 |
| 97. කෑගල්ල | 4503 | 976 | 22.38 | 647 | 14.83 | 1193 | 27.35 | 1018 | 23.34 | 3834 | 87.90 | 528 | 12.10 |
| 98. මාවනැල්ල | 3866 | 752 | 18.99 | 566 | 14.29 | 1200 | 30.30 | 974 | 24.60 | 3492 | 88.18 | 468 | 11.82 |
| 99. දෙහිඕවිට | 3698 | 537 | 14.34 | 420 | 11.21 | 1011 | 27.00 | 1030 | 27.50 | 2998 | 80.05 | 747 | 19.95 |
| **සමස්ත දිවයින** | **295991** | **52134** | **17.61** | **37086** | **12.53** | **83283** | **28.14** | **73701** | **24.90** | **246204** | **83.18** | **49787** | **16.82** |

වගුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 4632 | 1.40 | **330034** | 100.00 |
| 81-90 | 22207 | 6.73 | 325402 | 98.60 |
| 71-80 | 33213 | 10.06 | 303198 | 91.87 |
| 61-70 | 29260 | 11.90 | 269990 | 81.81 |
| 51-60 | 47374 | 14.35 | 230726 | 69.91 |
| 41-50 | 55910 | 16.94 | 183350 | 55.56 |
| **31-40** | **58708** | **17.79** | **127439** | **38.62** |
| 21-30 | 45879 | 13.90 | 68732 | 20.83 |
| 11-20 | 20818 | 6.31 | 22851 | 6.93 |
| 01-10 | 2015 | 0.61 | 2033 | 0.62 |
| 00-00 | 18 | 0.01 | 18 | 0.01 |

වගුව 5


ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : (31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලනවිට)

මෙම විෂයය සඳහා පෙනී සිටි 330 034 දෙනා අතුරෙන්, 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 58 708කි. එය ප්‍රතිශතයක් වශයෙන් 17.79% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 127 439ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 38.62%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙම ප්‍රශ්න පත්‍රයේ අයදුම්කරුවන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 26 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 85%කි. එමෙන් ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 31 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 23%කි.

1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි 1 වන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 100% කි. අඩු ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ 9 වන ප්‍රශ්නය යි. එම ප්‍රතිශතය 20%කි.

1.3.3. II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 01 වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 30කි. මෙම ප්‍රස්තාරයට අනුව 76% - 100% ප්‍රාන්තරයේ එනම් 23 - 30 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 9%කි. 51% - 75% ප්‍රාන්තරයේ එනම් 16 - 22 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 21%කි. 26% - 50% ප්‍රාන්තරයේ එනම් 8 - 15 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 37%කි. 00% - 25% ප්‍රාන්තරයේ එනම් 0 - 7 තෙක් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතිශතය 34%කි.


## 1.3.4 II පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 4.1** (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : 01 ප්‍රශ්නයෙහි (අ) (i) අනුකොටසෙහි පහසුතාව 33%ක් වන අතර එම ප්‍රශ්නයේ (ආ) (ii) 1 අනුකොටසේ පහසුතාව 82%ක් පමණ වේ.



අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018
33 - ඉතිහාසය
II පත්‍රයේ ප්‍රශ්නවල එක් එක් කොටසේ පහසුතා දර්ශකය
පහසුතා දර්ශකය
1.0
0.9
0.8
0.7
0.6
0.5
0.4
0.3
0.2
0.1
0.0
II කොටසේ ප්‍රශ්න කොටස් හා අනුකොටස් (ශ්‍රී ලංකා ඉතිහාසය)

ප්‍රස්තාරය 4.2

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018

33 - ඉතිහාසය

II පත්‍රයේ ප්‍රශ්නවල එක් එක් කොටසෙහි පහසුතා දර්ශකය




ප්‍රස්තාරය 4.3

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 01යි. මුළු ලකුණු 40කි.**

- ⋆ වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන වරණය තේරීම අපේක්ෂා කෙරේ.
- ⋆ සම්පූර්ණ විෂය නිර්දේශය ම ආවරණය වන පරිදි ප්‍රශ්න සකස් කර ඇත.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

## 2.1.2. I පත්‍රය

**1.** මහාවංසය සුවිශේෂී වන්නේ,
(1) දේශපාලන හා ආගමික තොරතුරු අඛණ්ඩව ඇතුළත් වීම නිසා ය.
(2) සමකාලීන තොරතුරු රචනා කර තිබීම නිසා ය.
(3) පැරණිතම වංසකතාව වීම නිසා ය.
(4) අඩංගු තොරතුරුවල විශ්වසනීයත්වය නිසා ය.

**2.** පුරාවිද්‍යාත්මක කැනීම්වලින් චීන, රෝම, අරාබි හා ඉන්දියානු කාසි ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමුවී ඇත. මෙයින් අනාවරණය වන වඩාත් ම වැදගත් කාරණය වන්නේ,
(1) ශ්‍රී ලංකාවේ දියුණු ආර්ථික රටාවක් පැවති බව ය.
(2) ශ්‍රී ලංකාවේ කාසි භාවිතය ප්‍රචලිතව පැවති බව ය.
(3) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර දියුණු වෙළෙඳ සබඳතා පැවති බව ය.
(4) ලෝකයේ විවිධ රටවලින් සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නට ඇති බව ය.

**3.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය වැනි මූලාශ්‍ර වැදගත් වන්නේ පහත සඳහන් කුමන කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ද?
(1) පොළොන්නරු අවධියේ සිට දඹදෙණි අවධිය දක්වා
(2) දඹදෙණි අවධියේ සිට ගම්පොළ අවධිය දක්වා
(3) ගම්පොළ අවධියේ සිට කෝට්ටේ අවධිය දක්වා
(4) කෝට්ටේ අවධියේ සිට මහනුවර අවධිය දක්වා

**4.** ශිලා ලිපිවල හිරු-සඳු සංකේතය යොදා ඇත්තේ කුමක් නිරූපණය කිරීම සඳහා ද?
(1) සෞභාග්‍යය (2) ස්ථාවරත්වය (3) වර්ෂාව (4) රාජ්‍ය අයිතිය

**5.** අප පුරාවස්තු රැකගත යුත්තේ ඒවා,
(1) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්වන සාධක නිසා ය.
(2) සංචාරක ව්‍යාපාරයට වැදගත් වන නිසා ය.
(3) බෞද්ධ හා හින්දු වාස්තු විද්‍යාත්මක නිර්මාණ නිසා ය.
(4) අතීත ශිල්පීය දක්ෂතා පෙන්වන සාධක නිසා ය.

**6.** ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබී ඇති වඩාත් ම පැරණි ස්ථානය ලෙස සැලකෙන්නේ,
(1) කුරුවිට බටදොඹ ලෙන ය.
(2) කිතුල්ගල බෙලි ලෙන ය.
(3) පාහියන්ගල ලෙන ය.
(4) අත්තනගොඩ අළු ලෙන ය.

**7.** පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තාක්ෂණික නිර්මාණ හා කිසියම් සම්බන්ධතාවක් ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පිරිසිදු තිරුවාණ | A - වැව |
| 2. වේගවත් සුළං ධාරා | B - ක්ෂුද්‍ර මෙවලම් |
| 3. කුඩා කඳු ගැට | C - අමුණ |
| 4. ගඟක නැම්ම | D - යකඩ නිස්සාරණය |

(1) A, B, C, D (2) B, D, A, C (3) C, B, A, D (4) D, A, B, C

**8.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගා නිම්නවලින් පිටත, කුඩා වැව් පද්ධති ආශ්‍රිතව ජනාවාස ව්‍යාප්තවීම ආරම්භ වූවා යැයි සැලකෙනුයේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේදී ය.
(3) මුල් ඓතිහාසික යුගයේදී ය. (4) ඓතිහාසික යුගයේදී. ය.

**9.** කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,
(1) මපුරුමුක ය. (2) පරුමක ය. (3) ගමික ය. (4) ගහපති ය.

**10.** සංවිධානාත්මක මධ්‍යගත පාලනයක් සඳහා අංගසම්පූර්ණ අගනුවරක් ඉදි කළේ
(1) විජයයි. (2) අනුරාධයි. (3) උපතිස්සයි. (4) පණ්ඩුකාභයයි.

**11.** අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණවලදී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවට හොඳ නිදසුනක් වන්නේ,
(1) සීගිරි රජ මාළිගයයි. (2) ආලාහන පිරිවෙනයි.
(3) මිහින්තලා දාන ශාලාවයි. (4) මැදිරිගිරිය වටදාගෙයයි.

**12.** අතීත ශ්‍රී ලංකාවේ වගා කන්න තුනක් පැවති බවට සාධක හමුවේ. තුන්වැනි කන්නය වගාකිරීම තීරණය වූයේ,
(1) ගම් නායකයාගේ අභිමතය පරිදි ය. (2) පසුගිය කන්නයේ ලැබූ අස්වැන්න මත ය.
(3) ගොවීන්ගේ උනන්දුව මත ය. (4) ජලය ලබාගැනීමේ හැකියාව පරිදි ය.

**13.** අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිත කළ නාමය
(1) සෙයිලාන් ය. (2) තප්‍රොබේන් ය. (3) සෙරන්ඩිබ් ය. (4) තම්බපණ්ණි ය.

**14.** පොළොන්නරු යුගයේදී 'ගවුත කණු' භාවිත කර ඇත්තේ,
(1) මහා මාර්ගවල දුර දැක්වීමට ය. (2) රාජ්‍ය අයිතිය දැක්වීමට ය.
(3) ඇළ මාර්ගවල දුර දැක්වීමට ය. (4) අභයභූමිවල සීමා දැක්වීමට ය.

**15.** පහත A, B, C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් කාලිංග මාඝ ආක්‍රමණය පැවති සමයේ ජීවත්වූවෙකුට දැනගන්නට **නොලැබෙන** සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?
A – ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ශ්‍රී ලංකාවට පැමිණීම
B – රුවන්මැලි චෛත්‍යය ගොඩනැංවීම
C – පළමුවන කාශ්‍යප රජු සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
D – සපුමල් කුමරා කලක් යාපනය පාලනය කිරීම
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

**16.** විශාල බරක් දැරිය හැකි වන සේ ඉදි කළ වාස්තු විද්‍යාත්මක නිර්මාණවලදී නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමයක් අනුගමනය කළ බවට සාධක ලැබෙන්නේ,
(1) රුවන්මැලිසෑයේ අත්තිවාරමේ ය. (2) මල්වතු ඔයේ ගල් පාලමේ ය.
(3) මාදුරු ඔයේ සොරොව්වේ ය. (4) සීගිරි මහ වැව් බැම්මේ ය.

**17.** ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම සඳහා කාන්තාවගේ දායකත්වය වැදගත් වූ බවට දිය හැකි හොඳම නිදසුන වන්නේ,
(1) පළමුවන විමලධර්මසූරිය දෝන කතරිනා විවාහ කර ගැනීම ය.
(2) පළමුවන විජයබාහු රජතුමා තිලෝකසුන්දරී කුමරිය සමග විවාහ වීම ය.
(3) පාණ්ඩ්‍ය කුමරකු සමග මිත්තා කුමරිය විවාහ වීම ය.
(4) සාලිය කුමරු අශෝකමාලා සමග විවාහ වීම ය.

**18.** 'චෙන් හෝ' නම් සෙන්පතියා යටතේ මෙරටට එල්ල වූ චීන හමුදා ආක්‍රමණයක් ගැන සඳහන් වන්නේ කුමන පාලන යුගයකදී ද?
(1) දඹදෙණිය (2) යාපහුව (3) ගම්පොළ (4) කෝට්ටේ

**19.** යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාවේ කුමන වෙළෙඳ ද්‍රව්‍යයක් ලබාගැනීම සඳහා දැඩි තරගයක නිරත වී ද?
(1) කුරුඳු (2) මැණික් (3) පුවක් (4) ඇත් දළ

**20.** පහත A සිට F දක්වා දී ඇති පාලකයන් අතුරෙන් පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළ පාලකයන් අඩංගු පිළිතුර තෝරන්න.
A – දොන් ජුවන් ධර්මපාල B – එදිරිමාන සිංහම්
C – සංකිලි D – පළමුවන රාජසිංහ
E – හත්වන බුවනෙකබාහු F – වරෝදය
(1) A හා B (2) B හා C (3) C හා D (4) E හා F

**21.** ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේදී සිදු කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා සිදු වූ ඓතිහාසික අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක් ද?

A – පළාත්බද නියෝජන ක්‍රමය

B – ව්‍යවස්ථාදායක හා විධායක සභාව

C – සෙනෙට් සභාව

D – සර්වජන ඡන්ද බලය

(1) A, B, D, C (2) A, C, D, B (3) B, A, D, C (4) B, D, A, C

- පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් **22** හා **23** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – නව බදු වර්ග පැනවීම

B – දේශීය නිලධාරීන් මගින් බදු එකතු කිරීම

C – රදළ ප්‍රධානීන්ගේ නිලතල වෙනස් කිරීම

D – පනවන ලද බදු, මුදලින්ම ගෙවීමට නියම කිරීම

E – ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම

**22.** ක්‍රිස්තු වර්ෂ 1797 දී ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට එරෙහිව මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට බලපෑ හේතු දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D

**23.** මියුරන් කොමිසමේ නිර්දේශ ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා E (3) B හා C (4) B හා E

- පහත A සිට F දක්වා ඇති ප්‍රකාශ ඇසුරෙන් **24** සිට **26** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 'මුස්ලිම් නෙයිසන්' පුවත්පත ඇරඹීම

B – කොළඹ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම

C – කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම

D – 'උදයභානු' පුවත්පත ඇරඹීම

E – වෙසක් පොහොය දිනය, නිවාඩු දිනයක් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම

F – ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම

**24.** හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා D (3) B හා E (4) C හා E

**25.** සිද්දි ලෙබ්බේ මහතා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා D (3) B හා D (4) C හා D

**26.** ආරුමුග නාවලර්තුමා සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා D (2) B හා C (3) C හා D (4) D හා F

**27.** ධනපති, කම්කරු හා මධ්‍යම යනුවෙන් සමාජ පන්ති තුනක් නිර්මාණය වූයේ කුමක ප්‍රතිඵලයක් ලෙසට ද?

(1) කාර්මික විප්ලවය (2) ප්‍රංශ විප්ලවය (3) පුනරුදය (4) ඇමෙරිකන් නිදහස් සටන

**28.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පුරවැසියකුගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස කඩ වූ අවස්ථාවකදී පෙත්සමක් ඉදිරිපත් කළ යුත්තේ,

(1) අභියාචනාධිකරණයට ය. (2) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.

(3) මහාධිකරණයට ය. (4) මහේස්ත්‍රාත් අධිකරණයට ය.

**29.** සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,

(1) පාර්ලිමේන්තු වාද-විවාද පැවැත්වීම ය. (2) මාධ්‍ය තුළින් කෙරෙන අදහස් විමසීම ය.

(3) ජනමත විචාරණයක් පැවැත්වීම ය. (4) සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම ය.

**30.** යුරෝපයේ පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් වූ පුද්ගලයින් I තීරුවේ ද, ඔවුන් ප්‍රසිද්ධියට පත් වූ ක්ෂේත්‍ර II තීරුවේ ද, දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මයිකල් ආංජිලෝ | A - දේශ ගවේෂණය |
| 2. බර්තොලමියුඩයස් | B - චිත්‍ර ශිල්පය |
| 3. විලියම් හාවේ | C - ආගමික ප්‍රතිසංස්කරණ |
| | D - වෛද්‍ය විද්‍යාව |

(1) A, C, D (2) B, A, D (3) B, C, D (4) C, B, D

**31.** ජර්මන් අධිරාජ්‍යයක් ගොඩනැගීමේ අරමුණින් කටයුතු කළ ප්‍රථම පාලකයා වූයේ,
(1) ඔටෝ වොන් බිස්මාර්ක් ය. (2) දෙවන විලියම් කෛසර් ය.
(3) වොන් වොල්ක් ය. (4) ඇඩොල්ෆ් හිට්ලර් ය.

● පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර **32** සිට **34** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ජාතීන්ගේ සංගමය
2. එක්සත් ජාතීන්ගේ සංගමය

B – 1. ලෝක සාමය
2. ආර්ථික සම්බාධක

C – 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. ඊශ්‍රායලය

D – 1. පරිසර දූෂණය
2. කාර්මිකකරණය

**32.** පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්නේ වැඩිවීම හේතු වන බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**33.** පළමුවැන්නේ අසාර්ථකත්වය දෙවැන්නේ ආරම්භයට හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**34.** දෙවැන්න පළමුවැන්නේ ප්‍රතිඵලයක් බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** දෙවන ලෝක යුද්ධයෙන් පසු මාර්ෂල් සැලැස්ම හඳුන්වාදීමේ අරමුණ වූයේ,
(1) විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීම ය.
(2) යටත් විජිතවල සමාජ-ආර්ථික කටයුතු ඉහළ නැංවීම ය.
(3) මිත්‍ර රටවල් ලෝක යුද්ධවලට අවතීර්ණ වීමට හේතු පහදා දීම ය.
(4) න්‍යෂ්ටික අවි නිෂ්පාදනය හා භාවිතය සීමා කිරීම ය.

**36.** පැසිස්ට්වාදයට එරෙහි වූවන් විනාශ කිරීම සඳහා "කළු කමිස හමුදාව" යොදාගත් ඒකාධිපති පාලකයා,
(1) බෙනිටෝ මුසෝලිනි ය. (2) ඇඩොල්ෆ් හිට්ලර් ය.
(3) වුඩ්රෝ විල්සන් ය. (4) වින්ස්ටන් චර්චිල් ය.

● පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් **37** හා **38** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – බොස්ටන් තේ සාදය
B – පර්ල් වරායට පහරදීම

**37.** ඇමෙරිකන් නිදහස් සටන සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**38.** දෙවන ලෝක මහා සංග්‍රාමය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**39.** තම දේශපාලන බල කඳවුරෙහි සාර්ථකත්වය උදෙසා යුදමය මැදිහත් වීමකින් තොරව උපායශීලීව කටයුතු කිරීමේ න්‍යාය හඳුන්වන නම කුමක් ද?
(1) න්‍යෂ්ටික අවිහරණය (2) ඉන්ධන නිෂ්පාදන පාලනය
(3) ආර්ථික සම්බාධක පැනවීම (4) සීතල යුද්ධය

**40.** නොබැඳි ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ පුරෝගාමියකු ලෙස කටයුතු කළ යුගෝස්ලෝවියානු ජනාධිපතිවරයා,
(1) අබ්දුල් ගමල් නසාර් ය. (2) මාෂල් ටිටෝ ය.
(3) ශ්‍රී ජවහර්ලාල් නේරු ය. (4) ලී ක්වාන් යූ ය.

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 01 | 21. | 03 |
| 02. | 03 | 22. | 02 |
| 03. | 04 | 23. | 04 |
| 04. | 02 | 24. | 03 |
| 05. | 01 | 25. | 01 |
| 06. | 03 | 26. | 04 |
| 07. | 02 | 27. | 01 |
| 08. | 03 | 28. | 02 |
| 09. | 02 | 29. | 03 |
| 10. | 04 | 30. | 02 |
| 11. | 02 | 31. | 02 |
| 12. | 04 | 32. | 04 |
| 13. | 03 | 33. | 01 |
| 14. | 01 | 34. | 03 |
| 15. | 02 | 35. | 01 |
| 16. | 01 | 36. | 01 |
| 17. | 01 | 37. | 03 |
| 18. | 03 | 38. | 04 |
| 19. | 01 | 39. | 04 |
| 20. | 03 | 40. | 02 |

වගුව 6


නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80කි.

I පත්‍රය සඳහා අවසන් ලකුණ $= \frac{80}{2} = 40$

2.1.4 **I** පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව



| විෂය ක්ෂේත්‍ර | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩි ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | 29 | 26 - 85% | 28 - 39% |
| ලෝක ඉතිහාසය | 11 | 30 - 78% | 31 - 23% |




2018 වසර ඉතිහාසය I පත්‍රය සැකසීමේ දී ශ්‍රී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 29ක් ද ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 11ක්ද ඇතුළත් වී ඇත. ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ සමස්ත පහසුතාව 63%ක් හා ලෝක ඉතිහාසය කොටසේ සමස්ත පහසුතාව 55%ක් බව අනාවරණය වේ. ශ්‍රී ලංකා ඉතිහාසය කොටස 10 ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය පෙළපොත්වල පාඩම් තේමාවලින් සකස් වී ඇත.

ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ සමස්ත පහසුතාව කෙරෙහි ඉතිහාසය විෂයයට අමතර ව චිත්‍ර, බුද්ධ ධර්මය, සිංහල වැනි විෂයයන්වලින් ද විෂය කරුණු ඉගෙන ගැනීම් අවස්ථා හිමිවීම බලපා ඇත. විශේෂයෙන් දැනුම පදනම් කරගත් ප්‍රශ්නවල පහසුතාව ඉහළ අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ පිහිටීම, ප්‍රාග් ඓතිහාසික ස්ථාන, පූර්ව ඓතිහාසික ස්ථාන, මුල් ඓතිහාසික ස්ථාන, අතීත ආගමික සමාජ සිදුවීම් හා ඊට සම්බන්ධ රජවරු, ජාතික ව්‍යාපාරය, නූතන දේශපාලන, ආර්ථික, සමාජයීය ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුම පදනම් කරගෙන ශ්‍රී ලංකා ඉතිහාසය ප්‍රශ්න සැකසී ඇත.

ලෝක ඉතිහාසය සම්බන්ධ ප්‍රශ්න පුනරුදය, කාර්මික විප්ලවය, ලෝකයේ කැපී පෙනෙන විප්ලව සහ ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් යන තේමා ඔස්සේ සැකසී ඇත. සමස්තයක් ලෙස ශ්‍රී ලංකා ඉතිහාසය ප්‍රශ්නවලට සමෝධානික ක්‍රමය මගින් අනෙකුත් විෂයයන් හරහා දැනුම අවබෝධය ලබාගත හැකි අවස්ථා පවතින බැවින් පහසුතාව 63%ක මට්ටමක පවතී.

ලෝක ඉතිහාසය හා සම්බන්ධ ප්‍රශ්න 11ක් අංක 30 සිට 40 දක්වා ඇතුළත් කොට ඇත. එහි දී පුනරුදය, ලෝක සංග්‍රාම සහ ලෝකයේ කැපී පෙනෙන විප්ලව යන තේමා සඳහා ප්‍රමුඛතාව හිමි වී ඇත. එහි පහසුතාව 55%කි. පෙළපොතේ මෙම තේමා සඳහා වැඩි අවධානයක් යොමු කිරීම තුළින් හා ලෝක ඉතිහාසය පිළිබඳ ප්‍රශ්න විචාර වැඩසටහන්, බුද්ධි මණ්ඩල සාකච්ඡා වැනි විෂයානුබද්ධ ක්‍රියාකාරකම් තුළින් සිසුන්ගේ සාධන මට්ටම තවදුරටත් වර්ධනය කර ගත හැකි වේ.

2.1.5 **I** පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | ප්‍රතිචාර නොදැක්වූ |
|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | |
| 1 | 01 | **46.7%** | 9.6% | 23.0% | 20.3% | 0.4% |
| 2 | 03 | 5.3% | 9.5% | **78.7%** | 6.4% | 0.1% |
| 3 | 04 | 11.1% | 11.7% | 32.1% | **44.9%** | 0.2% |
| 4 | 02 | 22.8% | **64.0%** | 2.9% | 10.1% | 0.3% |
| 5 | 01 | **65.4%** | 2.4% | 3.4% | 28.4% | 0.5% |
| 6 | 03 | 11.7% | 21.7% | **61.6%** | 4.8% | 0.3% |
| 7 | 02 | 3.5% | **78.9%** | 4.2% | 13.3% | 0.1% |
| 8 | 03 | 13.0% | 26.6% | **42.4%** | 17.8% | 0.2% |
| 9 | 02 | 12.8% | **51.8%** | 28.0% | 7.2% | 0.3% |
| 10 | 04 | 7.3% | 4.6% | 5.4% | **82.5%** | 0.2% |
| 11 | 02 | 24.9% | **46.3%** | 19.4% | 9.3% | 0.2% |
| 12 | 04 | 5.4% | 30.3% | 8.4% | **55.6%** | 0.2% |
| 13 | 03 | 14.4% | 14.7% | **57.8%** | 12.8% | 0.3% |
| 14 | 01 | **57.0%** | 13.1% | 13.1% | 16.4% | 0.4% |
| 15 | 02 | 17.3% | **47.1%** | 21.0% | 14.2% | 0.4% |
| 16 | 01 | **76.4%** | 11.0% | 5.8% | 6.7% | 0.1% |
| 17 | 01 | **74.0%** | 12.1% | 6.1% | 7.7% | 0.1% |
| 18 | 03 | 13.1% | 25.0% | **45.6%** | 15.9% | 0.4% |
| 19 | 01 | **75.5%** | 8.2% | 1.9% | 14.3% | 0.1% |
| 20 | 03 | 9.6% | 16.5% | **63.6%** | 10.0% | 0.3% |
| 21 | 03 | 14.3% | 13.4% | **56.0%** | 16.1% | 0.3% |
| 22 | 02 | 10.4% | **69.8%** | 10.5% | 9.0% | 0.3% |
| 23 | 04 | 7.7% | 13.2% | 18.7% | **60.1%** | 0.3% |
| 24 | 03 | 4.0% | 6.8% | **83.0%** | 5.9% | 0.3% |
| 25 | 01 | **82.2%** | 8.6% | 4.0% | 4.9% | 0.3% |
| 26 | 04 | 5.1% | 4.7% | 5.2% | **84.7%** | 0.2% |
| 27 | 01 | **64.1%** | 13.5% | 17.3% | 4.9% | 0.2% |
| 28 | 02 | 31.9% | **38.8%** | 13.8% | 15.1% | 0.4% |
| 29 | 03 | 13.2% | 7.9% | **61.7%** | 16.6% | 0.6% |
| 30 | 02 | 4.1% | **77.9%** | 14.1% | 3.4% | 0.5% |
| 31 | 02 | 51.2% | **22.9%** | 4.7% | 20.9% | 0.4% |
| 32 | 04 | 10.7% | 15.3% | 9.1% | **64.6%** | 0.3% |
| 33 | 01 | **59.3%** | 19.7% | 14.6% | 6.1% | 0.2% |
| 34 | 03 | 15.0% | 39.1% | **26.5%** | 19.1% | 0.3% |
| 35 | 01 | **39.9%** | 18.7% | 11.4% | 29.4% | 0.6% |
| 36 | 01 | **64.5%** | 22.5% | 6.6% | 6.1% | 0.3% |
| 37 | 03 | 9.9% | 9.3% | **68.3%** | 12.2% | 0.3% |
| 38 | 04 | 8.6% | 10.6% | 8.4% | **72.0%** | 0.4% |
| 39 | 04 | 15.7% | 5.9% | 13.9% | **64.2%** | 0.2% |
| 40 | 02 | 18.4% | **45.6%** | 22.5% | 13.3% | 0.1% |

වගුව 7

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6. I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2018 වර්ෂයේ I පත්‍රය සැකසීමේ දී ශ්‍රී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 29ක් ද, ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 11ක් ද ඇතුළත් කර ඇත.

I පත්‍රයේ පහසුතාව (60%) ඉක්ම වූ ප්‍රශ්න ගණන 23කි. ශ්‍රී ලංකා ඉතිහාසයෙන් ප්‍රශ්න 17 ද ලෝක ඉතිහාසයෙන් ප්‍රශ්න 6 ද ඇතුළත් වේ. ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ 10, 24, 25 සහ 26 යන ප්‍රශ්නවල පහසුතාව 80%ක් ඉක්මවා ඇත. 10 වන ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශයවීම ඇසුරෙන් ද 24, 25 සහ 26 යන ප්‍රශ්න ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය ඇසුරෙන් ද සකස් වී ඇත. එම ප්‍රශ්නවලට සම්බන්ධ විෂය කරුණු තහවුරු වීම සඳහා සිසුන් පෙළපොත පරිශීලනය කර ඇති අතර, ගුරුවරුන් විසින් භාවිත කරන ලද නිර්මාණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද එම ප්‍රශ්නවල පහසුතාව 80% ඉක්මවා යාමට හේතු වන්නට ඇත.

ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ ව 40%කට අඩු පහසුතාව පෙන්වා ඇත්තේ 28 වන ප්‍රශ්නයට පමණි. එහි පහසුතාව 39%කි. මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාවට නිදහස ලැබීම ඇසුරෙන් සකසා ඇත. මෙහිදී 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවාංග හා මූලික අයිතිවාසිකම් පිළිබඳ දැනුම හා අවබෝධය ශිෂ්‍යයා තුළ වැඩි දියුණු විය යුතු ය. මේ සඳහා පෙළපොත පරිශීලනයට සිසුන් උනන්දු කරවිය යුතු ය.

I පත්‍රයේ ලෝක ඉතිහාසයට ඇතුළත් ප්‍රශ්න 11න් පහසුතාව 60% ඉක්ම වූ ප්‍රශ්න සංඛ්‍යාව 6කි. එහි වැඩි ම පහසුතාව පෙන්නුම් කරන්නේ 30 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 78%කි. 31 හා 34 යන ප්‍රශ්න දෙක සඳහා 30%ට අඩු පහසුතාව පෙන්නුම් කරයි. එහි දී 31 වන ප්‍රශ්නය සඳහා 23% ද 34 වන ප්‍රශ්නය සඳහා 27% ද අඩු පහසුතා මට්ටමක් ලබා ඇත. ඉහත ප්‍රශ්න දෙක සකස් කොට ඇත්තේ 11 ශ්‍රේණියේ පෙළපොතේ ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් යන අවසාන පාඩම් ඇසුරෙනි. මෙම විෂය මාතෘකා පිළිබඳ ව ගුරු සිසු අවධානය වැඩි වශයෙන් යොමු කිරීම අවශ්‍ය වන අතර, දැනුම වැඩිදියුණු කිරීම සඳහා විවිධ ප්‍රභේද යටතේ සැකසුණු ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට හුරුව ලබා දිය යුතු ය.

I පත්‍රයේ ලෝක ඉතිහාසය කොටසේ ප්‍රශ්න විශ්ලේෂණය කිරීමේ දී 30 වන ප්‍රශ්නය 78% ක ඉහළ පහසුතාව ලබා ඇත. මෙම ප්‍රශ්නය පුනරුදය ඇසුරෙන් සකස් කර ඇත. එම ප්‍රශ්නයට අදාළ විෂය කරුණු පහළ ශ්‍රේණි මගින් ද පරිශීලනය වීම සිසුන්ගේ සාධන මට්ටම ඉහළ යාමට උපකාර වන්නට ඇත.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ව පින්තූර, සිතියම්, වගු, සටහන්, කණ්ඩායම් ක්‍රියාකාරකම්, පැවරුම්පත්, කෙටි ප්‍රශ්න සැකසීම, පෙරහුරු ප්‍රශ්න පත්‍ර හා පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීම, දැනුම මිනුම තරග ආදි ක්‍රියාකාරකම් මගින් I පත්‍රයේ සාධන මට්ටම වැඩි දියුණු කර ඉහළ සාධන මට්ටම කරා ළඟා විය හැක.

මේ සඳහා ඉතිහාසය විෂයය උගන්වන ගුරුභවතුන්ගේ දැනුම වැඩි දියුණු කරගැනීමට අවස්ථා සලසා දීම යෝග්‍ය වේ. පුහුණු වැඩමුළුවලට සහභාගි වීම, පාඨමාලා හැදෑරීම, නව තාක්ෂණික ක්‍රම භාවිතය සඳහා යොමුවීම හා අතිරේක පොත්පත් කියැවීම මගින් මෙම අරමුණ සාක්ෂාත් කරගත හැකි ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීතිය, මූලික අයිතිවාසිකම්, නන්වැදෑරුම් නිදහස ආදිය පිළිබඳ ව ගුරුභවතුන් තුළ ඉහළ ආකල්පයක් ඇතිකර ගත යුතු ය. ඒ තුළින් එම දැනුම, ආකල්ප හා කුසලතා සිසුන් තුළ තහවුරු කර ගත හැකි ය.

ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීම, ක්ෂේත්‍ර චාරිකා සැලසුම් කිරීම, ඉතිහාසය විෂයය කඳවුරු පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම ආදි ක්‍රියාකාරකම් මගින් ද සිසුන් වෙත ඉහළ සාධන මට්ටමක් ළඟා කර දීමට උපකාරී වේ.

## 2.2 II පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II පත්‍රයේ ව්‍යුහය

**II පත්‍රය** - කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.
මෙය I, II හා III වශයෙන් ප්‍රධාන කොටස් 3කින් යුක්ත ය.

**I කොටස**

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එහි (අ) හා (ආ) වශයෙන් කොටස් දෙකකි.
(අ) කොටස - සිතියම් ලකුණු කිරීම - ලකුණු 18යි.
(ආ) කොටස - ඓතිහාසික සිද්ධි හා පින්තූර ආශ්‍රිත කොටස් තුනකින් සමන්විත ය. ලකුණු 12යි.

ලකුණු 18 + 12 = 30

**II කොටස**

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 6කින් සමන්විත ය. ඉන් 4කට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න, නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කර ඇත.

**10 ශ්‍රේණිය - 1, 2, 3, 4, 5, 6, 7, 8, 10**
**11 ශ්‍රේණිය - 2, 3, 4, 5, 6** ලකුණු 18 × 4 = 72

**III කොටස**

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 2කින් සමන්විත ය. ඉන් එකකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න, නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කර ඇත.

**10 ශ්‍රේණිය - 9**
**11 ශ්‍රේණිය - 1, 7, 8** ලකුණු 18 × 1 = 18

**අවසාන ලකුණු ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 80 |
| II පත්‍රය | = | 120 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 = 100 |

.

2.2.2 II පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2, හා 4.3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

## I කොටස

### 1 ප්‍රශ්නය

**1. (අ)** පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගල් ඔය, යාන් ඔය, පදවිය වැව, මිනිපේ අමුණ, ගම්පොළ, පුත්තලම, ඌරාතොට, මීගමුව, තිරුකේතීශ්වරම්, කාලතිත්ථ, දඹකොළපටුන, මිහිඟාගල්කන්ද (ලකුණු 12 යි)

(ii) වතිකානුව, බුරුමය, කැලිකට්, බතාවිය, හිරෝෂිමා, සූවස් ඇළ (ලකුණු 06 යි)

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - පළමුවන විජයබාහු රජුගේ කුලී හමුදාව හැඳින්වූ නම

*B* - ක්‍රි.ව. 1498 දී ඉන්දියාවට පැමිණි පෘතුගීසි නාවිකයා

*C* - දෙවන ලෝක මහා සංග්‍රාම අවධියේ මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාම අවධියේ ජපානය පාලනය කළ අධිරාජයා (ලකුණු 04 යි)

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' අක්ෂරයෙන් දක්වා ඇති මූර්තිය හඳුන්වන නම කුමක් ද?
2. එය දක්නට ලැබෙන පූජනීය ස්ථානය කුමක් ද?
3. මෙයින් නිරූපිත පුද්ගලයා කවරෙකු ලෙස හඳුනාගෙන තිබේ ද?
4. මෙම කලා කෘතිය ශ්‍රී ලංකාවේ කුමන රාජධානි යුගයකට අයත් ද? (ලකුණු 04 යි)



*A*




*B*

(iii) 1. '*B*' වලින් දැක්වෙන චිත්‍රයේ නිරූපිත පුද්ගලයාගේ නම දක්වන්න.
2. මෙතුමා ශ්‍රී ලංකාවේ කවර රාජධානියක පාලකයා වී ද?
3. රාජ්‍යත්වයට පත්වීමට පෙරදී මෙතුමා හැඳින්වූයේ කවර නමකින් ද?
4. මෙම චිත්‍රය අඳින ලදැයි සැලකෙන පුද්ගලයා නම් කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


1 ප්‍රශ්නය

**(1) (අ) (i)**




(ලකුණු 12)

**(1) (අ) (ii)**


N
හිරෝෂිමා
බතාවිය
බුරුමය
කැලිකට්
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean
යුරෝපය
ஐரோப்பா
Europe
වතිකානුව
සූවස් ඇළ
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa


**(ලකුණු 06යි)**

**(ආ)** **(i)** A - වෙළෙක්කාර හමුදාව
B - වස්කොඩ ගාමා
C - සර් වින්ස්ටන් චර්චිල් / වින්සන්ට් චර්චිල්
D - හිරෝහිතෝ අධිරාජ්‍යයා / හිරෝහිතෝ **(ලකුණු 01 × 04 = 04යි)**

**(ii)** 1. - අශ්ව හිස හා මිනිසා / මිනිසා සහ අශ්වහිස
2. - ඉසුරුමුණිය / ඉසුරුමුණි විහාරය
3. - පර්ජන්‍ය / පර්ජන්‍ය දෙවියා
4. - අනුරාධපුර **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** 1. - දෙවන රාජසිංහ
2. - මහනුවර / සෙංකඩගල / උඩරට / කන්ද උඩරට
3. - මහා අස්ථාන කුමරු / මහා අස්ථාන
4. - රොබට් නොක්ස් **(ලකුණු 01 × 04 = 04යි)**


1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




01 ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව 100%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 16 - 22 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 23 - 30 ප්‍රාන්තරයේ 9%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 23 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 9%ක් වන අතර අයදුම්කරුවන්ගේ 33%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයේ වැඩි ම පහසුතාව පෙන්වා ඇත්තේ (ආ) කොටසේ (ii) 1 අනුකොටස වන අතර, එහි පහසුතාව 82% වේ. අඩු ම සාධනයක් දක්වා ඇත්තේ (අ) (ii) කොටසට ය. එහි පහසුතාව 26%කි.

පළමු ප්‍රශ්නයේ (අ) කොටසෙහි (i) (ii) පිළිවෙළින් ශ්‍රී ලංකා සිතියම් හා ලෝක සිතියම් කොටස ඇතුළත් වේ. එහි පහසුතා පිළිවෙළින් 33% හා 26%කි. මෙයට හේතුව සිතියම් ලකුණු කිරීමේ දී ප්‍රායෝගික අත්දැකීම් ඵලදායී ලෙස භාවිත නොකිරීම හා පෙළපොත් නිවැරදිව පරිශීලනය නොකිරීම ය. සිතියම් ලකුණු කිරීම පිළිබඳ ව සිසු සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පන්ති කාමරය තුළ නිවැරදි සිතියම් ප්‍රදර්ශනය කිරීම හා ඒවායෙහි නියමිත ස්ථාන ලකුණු කර, නම් කිරීමට සිසුන් පෙළඹවීම යෝග්‍ය වේ. ඓතිහාසික වශයෙන් වැදගත් වන ස්ථානවල අතීත හා වර්තමාන නාම, ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ස්ථාන, රාජධානී ආදිය වෙන වෙන ම ලකුණු කරවීමෙන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර හා පසුගිය (සා.පෙළ) විභාග ප්‍රශ්නවලට පිළිතුරු ලියවීමෙන් සහ ඒවා සාකච්ඡා කිරීමෙන් සිසුනට ඉහළ සාධන මට්ටමක් අත්කර දිය හැකි ය.

(ආ) (i) කොටසෙහි A, B, C හා D අනුකොටස් පිළිවෙළින් 41%, 43%, 29% හා 29% ලෙස පහසුතා මට්ටම්වල පවතී. මේ අතරින් වැඩි ම පහසුතාවක් (43%) දක්වා ඇත්තේ "B" අනුකොටසට ය. මේ අතරින් C හා D අනුකොටස් අඩු පහසුතාව පෙන්වා ඇති අතර එය 29%කි. පොදුවේ මෙම ප්‍රශ්නවල අඩු පහසුතාව දක්නට ලැබෙන්නේ ලෝක ඉතිහාසය කොටසට සම්බන්ධ නිසා ය. පෙළපොත හොඳින් පරිශීලනය කිරීමෙන් ලෝක ඉතිහාසය පිළිබඳ අවබෝධය ඉහළ මට්ටමකට ළඟා කර ගත හැකි ය.

(ආ) (ii) ඓතිහාසික පින්තූර හා සම්බන්ධ (i) හා (ii) කොටසෙහි පිළිවෙළින් 82% හා 76% පහසුතාව ලබා ඇති අතර, (iii) කොටස 31%ක අඩු පහසුතාව පෙන්නුම් කරයි.

(ආ) (iii) ලෝක ඉතිහාසයට අදාළ රූපසටහනෙහි 1 හා 2 පිළිවෙළින් 63% හා 76% ඉහළ පහසුතා පෙන්නුම් කරයි. මෙහි 3 අනුකොටස 30%ක අඩු පහසුතාව දක්වා ඇත.

ඉහත (ආ) 2 හා 3 පින්තූර ආශ්‍රිත ප්‍රශ්නයේ කොටස් 8න් 6ක පහසුතාව ඉහළ මට්ටමක පවත්වාගෙන ගොස් ඇත්තේ ශ්‍රී ලංකා ඉතිහාසය හා සම්බන්ධ පින්තූර නිවැරදි ව අධ්‍යයනය කොට ඇති නිසාය. තව ද, පහළ ශ්‍රේණිවල දී මෙම කොටස් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබී තිබීම ද හේතුවක් විය හැකි ය.

පාඩම්වලට අදාළ සුවිශේෂී පින්තූර හඳුනාගෙන ඒවා පංතිකාමරය තුළ ප්‍රදර්ශනය කිරීම යෝග්‍ය වේ. 10, 11 විෂය නිර්දේශයට අදාළ පින්තූර ඇතුළත් පොත් පිංචක් සකස් කිරීම ආදි ක්‍රියාකාරකම් මගින් ඉහළ පහසුතාව අත් කර දිය හැකි ය.

එසේම ශ්‍රී ලංකා සිතියම හා ලෝක සිතියම නිරන්තර භාවිතයට ගැනීම, ලකුණු කර නම් කිරීම, විෂය මාලාවට අදාළ ඓතිහාසික පින්තූර අඩංගු පොත් පරිහරණය ආදියට වැඩි අවස්ථාවක් ලබාදීම යෝග්‍ය වේ.

## II කොටස

**2 ප්‍රශ්නය**

අභිමතාර්ථය : ශ්‍රී ලංකාව ජනාවාසවීම හා මුල් මානවයා, ජීවත් වූ පරිසර කලාපයෙන් ද, පූර්ව ඓතිහාසික හා මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ ජනතාවගේ ජීවන රටාව පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම

**2.** (i) *A* - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල් ම මානවයා හඳුන්වන නම ද
*B* - ඔවුන් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ පරිසර කලාප **දෙකක්** ද දක්වන්න. (ලකුණු 03 යි)
(ii) පූර්ව ඓතිහාසික යුගය පරිවර්තන යුගයක් ලෙස සැලකීමට හේතු වූ සාධක **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)
(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) ඓතිහාසික යුගයේ පැවති ආර්ථික රටාව තුළ කෘෂිකර්මාන්තය සංවිධානය වී තිබූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2. (i)** **A** - හෝමෝ සේපියන් / හෝමෝ සාපියන්

**B** - අර්ධ ශුෂ්ක කලාපය
- පහත රට වියළි කලාපය
- පහත රට අතර මැදි වියළි කලාපය
- තෙත් කලාපය
- කඳුකර වියළි අතර මැදි කලාපය
- ශුෂ්ක කලාපය

(මින් කලාප දෙකක් නම් කිරීම අපේක්ෂා කෙරේ.) **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)**
- පිළිස්සූ මැටි වළං භාවිතය / සකපෝරුව භාවිතය
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම
- යකඩ ලෝහය භාවිතය
- ස්ථාවර නිවාස (ස්ථිරවාසීතාව) ඉදිකිරීමට යොමු වීම
- කෘෂිකර්මාන්තයට යොමු වීම


(මින් දෙකක් සඳහන් කිරීමට) .... **(ලකුණු 02 × 02 = 04යි)**

**(iii)**
- කුඩා වැව් කේන්ද්‍ර කර ගෙන ජනාවාස ඇරඹීම
- ගංගාවල පිටාර නිම්නයන්ට පිටතින් ජනාවාස ව්‍යාප්ත වීම
- විවිධ වෘත්තීන් පදනම් කර ගනිමින් ජනාවාස බිහිවීම
  (උදා. ධීවර ගම්, වළං තනන්නන්ගේ ගම්, වරාය ආශ්‍රිත ගම්, ගොපල්ලන්ගේ ගම් ......)
- පවුල් සංඛ්‍යාව 5-6 සිට 30 අතර වීම
- ගමික, ගමේ ප්‍රධානියා වීම
- ගම්. කුඩා කැලෑ රොදකින් වෙන්වීම
- ජන සංඛ්‍යාව වැඩි ජනාවාස, නගර ලෙස හැඳින්වීම
- කුඩා වැව් / ගම් වැව් / කේන්ද්‍රකරගෙන ජනාවාස ඇරඹීම
- අපරික්ඛිත ගම්
- පරිඛිත්ත ගම් **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** - කෘෂි කර්මාන්තය බෝග වගාව, සත්ව පාලනය යනුවෙන් ප්‍රධාන අංශ දෙකක් යටතේ සංවිධානය වී තිබීම
- බෝග වගාව - මඩ ගොවිතැන (වී වගාව)
  ගොඩ ගොවිතැන (හේන් වගාව)
- කන්න ලෙස වගා කිරීම (යල/ මහ/ අතරමැදි)
- සත්වපාලනය
- ඇති කළ සතුන් (ගවයන්, එළුවන්, කුකුළන්)

(කරුණු තුනක් හා එයට නිදසුන් තුනක් අපේක්ෂා කෙරේ.) **(ලකුණු 03 + 03 = 06යි)**


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 94%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 34%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 16%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 30%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස *(i) A* වන අතර එහි පහසුතාව 77%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iii)* කොටස වන අතර එහි පහසුතාව 31%කි.

ශ්‍රී ලංකාව ජනාවාස වීම හා මුල් මානවයා ජීවත් වූ පරිසර කලාපය සහ පූර්ව ඓතිහාසික හා මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ ජනතාවගේ ජීවන රටාව පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති අතර, එම ප්‍රශ්නය තෝරාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 94%කි. මෙහි (i) කොටස A හා B වශයෙන් අනුකොටස් දෙකකි. ඒවායේ පහසුතා පිළිවෙළින් 77% හා 73% ලෙසින් ඉහළ අගයක් ගෙන ඇත. මෙහි ඉහළ පහසුතාවක් ලබා ගැනීමට ඉවහල් වී ඇත්තේ සමෝධානික ලෙස 6 වසර සිට මෙම කරුණු අධ්‍යයනයට යොමු වීම විය හැකි ය. එසේම ප්‍රාග් ඓතිහාසික ස්ථාන ලකුණු කිරීමේ දී පරිසර කලාප පිළිබඳ ව අවබෝධයක් ලබා තිබීම ද ඊට ඉවහල් වී ඇත.

(ii) කොටසේ පහසුතාව 61%කි. ඓතිහාසික යුග පිළිබඳ ව පෙළපොත ඇසුරෙන් තවදුරටත් කරුණු අධ්‍යයනය කිරීම සිසු සාධන මට්ටම වර්ධනයට හේතු වේ.

(iii) හා (iv) කොටස්වල පහසුතා පිළිවෙළින් 31% හා 38%ක ප්‍රමාණයක් වාර්තා වී ඇත. අවබෝධය හා විශ්ලේෂණ හැකියාව වර්ධනය කරගැනීම සඳහා පෙළපොත පරිහරණයට, පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීමට හා අතිරේක කියවීමට සිසුන් යොමු කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ජනාවාසකරණයේ දී ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික යුග වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම පිළිබඳ නිරවුල් අවබෝධය සිසුන් තුළ තහවුරු කිරීමට ගුරු අවධානය යොමු විය යුතු ය.

## 3 ප්‍රශ්නය

**අභිමතාර්ථය : ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන බිහිවීම, ජල කළමනාකරණය ආශ්‍රිත නිර්මාණ පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

**3.** (i) *A* - අනුරාධපුරය

*B* - පොළොන්නරුව

*C* - මාගම යන අතීත පාලන මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ කවර ගංගා නිම්න ආශ්‍රිත ව දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

(කලා ඔය, කිරිඳි ඔය, මහවැලි ගඟ, වලවේ ගඟ, මල්වතු ඔය, ගල් ඔය) (ලකුණු 03 යි)

(ii) *A* - අනුරාධපුර නගරයට ජලය සැපයීම සඳහා ඉදිකරන්නට ඇතැයි සැලකෙන වැව් **දෙකක්** ද,

*B* - භික්ෂූන් වහන්සේලා සඳහා ඉදි කළ පොකුණු **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඓතිහාසික යුගයේදී විශාල වාරි පද්ධති නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූයේ ඇයි දැයි සාධක **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) *A* - වැව් බැම්ම

*B* - සොරොව්ව

*C* - බිසෝකොටුව

*D* - පිටවාන යන වැවක දක්නට ඇති තාක්ෂණික අංග අතුරෙන් **දෙකක** නිර්මාණය හා කාර්යය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

**3. (i)** *A* - මල්වතු ඔය

*B* - මහවැලි ගඟ

*C* - කිරිඳි ඔය **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - තිසා වැව, නුවර වැව, බසවක්කුලම වැව (අභය වැව)

*B* - කුට්ටම් පොකුණ, ඇත් පොකුණ. කුමාර පොකුණ, නෙළුම් පොකුණ

**(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** - කෘෂි කටයුතු සඳහා ජලය සැපයීම / වී වගාව සඳහා ජලය සැපයීම
- ගංවතුර පාලනය
- නාගරික ජනතාවගේ ජල අවශ්‍යතා සපුරා ගැනීම
- වැඩිවන ජනගහනය අනුව ආහාර නිපදවීමට අවශ්‍ය ජලය ලබා ගැනීම
- නියං කාලවල දී ජල අවශ්‍යතා සපුරා ගැනීම / වර්ෂාවේ අවිනිශ්චිතතාවය

**(ලකුණු 02 + 02 + 01 = 05යි)**

**(iv) A** - වැව් බැම්ම

නිර්මාණය :

- කුඩා කඳු ගැට දෙකක් යා කොට නිමවා තිබීම
  උදා : නාච්චදූව වැව
- කඳු ගැට නොමැති අවස්ථාවල දී චාපාකාර ලෙස වැව් බැම්ම නිමවීම
  (උදා : යෝධ වැව)
- පස්, මැටි, බොරළු, කිරි මැටි, ආදිය යොදා ගෙන ඉතා තදින් තලා ශක්තිමත්ව බැම්ම නිර්මාණය කිරීම
  උදා : සීගිරිය වැව
- ඇතැම් අවස්ථාවල දී වැව් බැම්ම සඳහා පිහිටි ගල්තලා යොදා ගැනීම
  උදා : සොරබොර වැව
- ක්වාට්ස් ස්ථර වැව් බැම්ම ඉදි කිරීමේ දී සැලකිල්ලට ගැනීම
  උදා : මින්නේරිය වැව

කාර්යය : ජලය රඳවා ගැනීම / ජලය රැස්කර තැබීම / ජලය ගබඩා කර තැබීම

**B** - සොරොව්ව

නිර්මාණය : විශාල ගල් පතුරු, පිළිස්සු ගඩොල් යොදා ගනිමින් වැව් බැම්මේ නිශ්චිත උසකින් විවරයක් ලෙස නිර්මාණය කෙරේ.
විශාල වැව්වල ගොඩ සොරොව්ව හා මඩ සෙරොව්ව ලෙස දක්නට ලැබීම

කාර්යය :

- ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම (ගොඩ සෙරොව්ව)
- රොන් මඩ ඉවත් කිරීමේ දී භාවිත කිරීම (මඩ සොරොව්ව)

**C** - බිසෝ කොටුව

නිර්මාණය : ගල් පතුරු යොදා ගනිමින් ආයත චතුරාශ්‍රාකාර අවකාශයක් ලෙස නිර්මාණය කෙරේ.

කාර්යය : ජලය ප්‍රධාන ඇළට නිකුත් කිරීමේ දී ''වැව් බැම්මට'' ඇතිවන පීඩනය අවම කරමින් ජලය මුදා හැරීම


**D** - පිටවාන

නිර්මාණය : ගල් කුට්ටි සියුම් ලෙස එකිනෙකට තද වන සේ සකස් කරමින් වැවක කෙළවර වැව් බැම්මට පහළින් ඉදිකර තිබීම.
සමහර වැව්වල ස්වාභාවික පිහිටි ගල්තලා උදව් කර ගෙන ඇත.

කාර්යය : වැව් බැම්මට හානියක් නොවන පරිදි වැවට එකතුවන වැඩි ජලය ඉවත් වීම මින් සිදු වේ.

**(ලකුණු 03 + 03 = 06යි)**


3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 87%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් ප්‍රතිශතය 14%ක් වන අතර, අයදුම්කරුවන්ගේ 22%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) B අනුකොටස වන අතර, එහි පහසුතාව 60%කි. පහසුතාව අඩු ම කොටස (ii) A අනුකොටස වන අතර එහි පහසුතාව 30%කි.

ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන බිහිවීම සහ ජල කළමනාකරණය ආශ්‍රිත නිර්මාණ පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර, එම ප්‍රශ්නය තෝරාගෙන ඇති ශිෂ්‍ය ප්‍රතිශතය 87%කි. මෙහි පළමුවන කොටසේ ඇති B අනුකොටස සඳහා 60%ක ඉහළ පහසුතාව ද (ii) A අනුකොටස සඳහා 30%ක අඩු ම පහසුතාව ද දක්වා ඇත. වාරි කර්මාන්තයේ වාරි තාක්ෂණික අංග පිළිබඳ නිර්මාණය හා කාර්යය ලෙස වෙන් වෙන් වශයෙන් දැනුම හා අවබෝධය සිසුන් තුළ වර්ධනය කිරීමට ඉගැන්වීමේ ක්‍රමෝපායන් සම්පාදනය කළ යුතු ය.

මෙම ප්‍රශ්නයේ පහසුතාව 60% හා 30% පරාසයක් අතර පවතී. සිසුන් 87% මෙම ප්‍රශ්නය තෝරාගනු ලැබුව ද, බහුතරයකට ඉහළ පහසුතාවක් කරා ළඟාවීමට අපහසු වී ඇත. වාරි කර්මාන්තයේ එක් අරමුණක් වන්නේ නාගරික ජල අවශ්‍යතා සම්පාදනයයි. ඒ සඳහා ඉදි කරන ලද වැව් වෙන්කොට හඳුනාගැනීම පිළිබඳ ව ගුරු සිසු අවධානය යොමු කළ යුතු ය.

වැඩි පිරිසකට ඉහළ සාධක මට්ටමකට ළඟා වීමට නොහැකි වීමට හේතුව වී ඇත්තේ ගංගා හා ඓතිහාසික රාජධානි පිළිබඳ පවතින සබඳතාවයේ දුරාවබෝධය යි. වැව හා වැවේ අංග පිළිබඳ සිසුන් තුළ දැනුම හා කුසලතා වර්ධනයට ප්‍රායෝගික අවස්ථා සම්පාදනය, ක්ෂේත්‍ර චාරිකා, ප්‍රදර්ශන වැනි ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කිරීම වැදගත් වේ.

**4 ප්‍රශ්නය**

**අභිමතාර්ථය : ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන බිහිවීම. ආර්ථික කටයුතුවල ස්වභාවය හා කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ කාර්යය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම.**

**4.** (i) *A* - රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ බිහි වූ රාජධානියේ නම
*B* - එම රාජධානියේ පාලක පරපුර හැඳින්වූ නම
*C* - වියළි කලාපයේ තැනින් තැන බිහි වූ කුඩා පාලන ඒකක හැඳින්වූ නම
පිළිවෙළින් දක්වන්න. (ලකුණු 03 යි)

(ii) *A* - දෙවන නාගරීකරණ යුගයේදී උස් පර්වත ආශ්‍රිත ව ඉදිකරන ලද පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද
*B* - කඳුවැටි හා ගංගා ආශ්‍රිත ව ඉදිකරන ලද පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ යුගයේදී, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ වෙළෙඳාමේ ස්වභාවය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා
*A* - රටේ දේශපාලන ස්ථාවරත්වයක් ඇති කිරීමට කටයුතු කළ ආකාරය ගැන ද
*B* - එතුමාගේ රාජ්‍ය සමයේදී රටෙහි ඇති වූ අධ්‍යාපන හා සාහිත්‍ය දියුණුව පිළිබඳව ද
කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 06 යි)

**4. (i)** *A* - යාපනය
*B* - ආර්ය චක්‍රවර්ති
*C* - වන්නි ප්‍රදේශ / වන්නි **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - දඹදෙනිය, යාපහුව, කුරුණෑගල
*B* - ගම්පොළ (ගඟසිරිපුර), මහනුවර (සෙංකඩගල) **(ලකුණු 01 × 04 = 04යි)**


**(iii)** - කුරුඳු ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය වීම
- වෙනත් කුළුබඩු වර්ග ද අපනයනයට යොමු වීම
(එනසාල්, සාදික්කා, ගම්මිරිස් ආදිය .......)
- වටිනා වෙළඳ ද්‍රව්‍ය ද අපනයනය කිරීම. (ඇත්දත්, මුතු මැණික් ආදී)
- විදේශ වෙළෙඳ සබඳතා පැවතීම. (උදා: පර්සියාව, ඉන්දියාව. ආරාබිය, චීනය, ඊජිප්තුව)
- විදේශීය වෙළෙඳාම රජුගේ ඒකාධිකාරයක් වීම.
- බටහිර වෙරළබඩ වරායන් වෙළෙඳාමේ දී වැදගත් වීම.
(පුත්තලම, කල්පිටිය, කොළඹ, ගාල්ල, හලාවත ආදී)
- පිඟන් ඇතුලු වෙළෙඳ ද්‍රව්‍ය ආනයනය කිරීම. - චීනයෙන්
- දේශීය වෙළෙඳාමත් ක්‍රියාත්මක වූ බව කුරුණෑගල විස්තරය නම් පුස්කොල පොතේ සඳහන්ව තිබීම. **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv) (a)** - වන්නි ප්‍රදේශ යටත් කර ගැනීම
- උඩරට ජෝතිය සිටානන්ගේ කැරැල්ල මැඩ පවත්වා එහි අවනත බව ලබා ගැනීම
- සපුමල් කුමරු යවා යාපනය ජය ගැනීම

**(b)** - පිරිවෙන් අධ්‍යාපනයට අනුග්‍රහය දැක්වීම
(උදා : සුනේත්‍රා දේවී, කැරගල පද්මාවතී ආදී.......)
- උගත් පඬිවරු බිහිවීම
(උදා : තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, කැරගල වන රතන හිමි, විදාගම මෛත්‍රී හිමි, ඉරුගල් කුලතිලක පිරිවෙන් හිමි)
- සංදේශ සාහිත්‍ය ප්‍රචලිත වීම
(උදා : ගිරා, පරෙවි, සැළලිහිණි ආදී ......)
- වෙනත් සාහිත්‍ය කෘතීන් ද රචනා වීම
(උදා : භක්ති කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, හටන් කාව්‍ය හා කෝෂ ග්‍රන්ථ)
- රජතුමා ද ග්‍රන්ථකරණයේ නියුතු වීම.
(රුවන්මල්නිඝණ්ඩුව)
පැරකුම්බා සිරිත, ගුත්තිල කාව්‍ය, කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය ... ආදී

**(ලකුණු 02 + 04 = 06යි)**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 25%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර, 42%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 62%කි. එසේම පහසුතාව අඩු ම කොටස (ii) *B* අනුකොටස වන අතර එහි පහසුතාව 29%කි.

ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන බිහිවීම, ආර්ථික කටයුතුවල ස්වභාවය හා කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ කාර්යය පිළිබඳ ව දැනුම හා අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සැකසී ඇත. සමස්ත ප්‍රශ්නය තෝරාගෙන ඇති සිසුන් ප්‍රතිශතය 25%කි. මෙම ප්‍රශ්නයේ පළමු කොටස A, B හා C ලෙසින් අනුකොටස් තුනකින් සමන්විත ය. ඉන් A අනුකොටස 62%ක වැඩි ම පහසුතාවක් පෙන්වයි. ප්‍රශ්නයේ අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ (ii) කොටසේ B අනුකොටස සඳහා ය. එහි පහසුතාව 29%කි.

සමස්තයක් ලෙස ගත්කල (i) කොටසේ "A" අනුකොටස හැර අන් සියලු කොටස් 43%කට වඩා අඩු පහසුතාවක් දක්වා ඇත. සමස්ත ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තුළින් අඩුවෙන් ම තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නය යි. මෙයට හේතු වී ඇත්තේ වෙනත් ශ්‍රේණිවල දී මෙම විෂය කරුණු අධ්‍යයනය කළ ද එයට අවධානය යොමු නොකිරීම යි. පෙළපොත පරිහරණය කිරීමේ වැදගත්කම අවබෝධ කරවීම හා ප්‍රියමනාප ලෙස පාඩම් කොටස් ඉදිරිපත් කිරීම තුළින් ඉහළ සිසු සාධන මට්ටම් ළඟා කරගත හැකි ය. ක්ෂේත්‍ර චාරිකාවල දී මෙම නාගරීකරණ අවධි ආවරණය වන ලෙස සංවිධානය කළ යුතු ය.

පළමුවන නාගරීකරණය හා දෙවන නාගරීකරණය අතර ඇති වෙනස හඳුනාගැනීම සඳහා සංසන්දනාත්මකව කරුණු දක්වමින් අවබෝධය තහවුරු කළ යුතු ය. සංකීර්ණ කරුණු රාශියක් මේ කාලසීමාවට අයත් වන හෙයින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය මනාව සංවිධානය කිරීමට ගුරුභවතුන්ගේ අවධානය යොමුවිය යුතු ය.

**5 ප්‍රශ්නය**

**අභිමතාර්ථය : මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලන ප්‍රදේශ සහ පාලනය හා සම්බන්ධ නිලධාරීන් එහි සමාජ ආර්ථික කටයුතු පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම**

**5.** (i) මහනුවර රාජධානියට අයත්ව තිබූ පාලන ප්‍රදේශ අතුරෙන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර යුගයේ පහත සඳහන් කාර්යයන් භාරව කටයුතු කළ තැනැත්තන්ගේ නිල නාම වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - රජතුමාගේ අලි ඇතුන් භාරව කටයුතු කිරීම

*B* - රජවාසලට ආහාර පාන සැපයීම

*C* - රජතුමාගේ ඇඳුම් හා ආභරණ භාරව කටයුතු කිරීම

*D* - කුඩා ම පරිපාලන ඒකකය වූ ගමක් භාරව කටයුතු කිරීම

[විදානේ, කෝරාළ, සළුවඩන නිලමේ, ගජනායක නිලමේ, බත්වඩන නිලමේ, කොඩිතුවක්කු නිලමේ, දියවඩන නිලමේ] (ලකුණු 04 යි)

(iii) උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානි සමයේ

*A* - කෘෂිකර්මය

*B* - කර්මාන්ත

සංවිධානය වී තිබූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

**5. (i)**

| | | | |
|---|---|---|---|
| - හත් කෝරළය | - උඩුනුවර | - තුමන්කඩුව | - ඌව |
| - යටිනුවර | - මාතලේ | - තුම්පනේ | - වලපනේ |
| - හාරිස්පත්තුව | - බින්තැන්න | - දුම්බර | - වෙල්ලස්ස |
| - හේවාහැට | - නුවර කලාවිය | - කොත්මලේ | - හතර කෝරළය |
| - උඩබුලත්ගම | - තුන් කෝරළය | - පාතබුලත්ගම | - සබරගමුව |
| - උඩපලාත | | | |

(ඉතිහාසය 10 පෙළපොත 112 පිටුව)

(මින් තුනක් නම් කිරීම අපේක්ෂා කෙරේ.) **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - ගජනායක නිලමේ

*B* - බත්වඩන නිලමේ

*C* - සළුවඩන නිලමේ

*D* - විදානේ **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** - විවාහ ක්‍රම තුනක් දක්නට ලැබේ.

(එකගෙයි කෑම, දීග විවාහය, බින්න විවාහය, බහුපුරුෂ සේවනය)

- විවාහය කුලය මත තීරණය වීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv) A කෘෂිකර්මාන්තය**

- මූලික වශයෙන් කෘෂි අර්ථ ක්‍රමයක් පැවතීම
- වී වගාව - හෙල්මළු
- ගෙවතු වගාව - කොස්, පොල් ...
- හේන් ගොවිතැන - ඇල් වී
- සත්ව පාලනය ද වැදගත් වීම - එළුවන්, කුකුළන්
- කෘෂි කටයුතු සඳහා අත්තම් ක්‍රමය යොදා ගැනීම

**B කර්මාන්තය**


- කුල ක්‍රමය අනුව කර්මාන්ත සංවිධානය වී තිබීම

  උදා : ලාක්ෂා කර්මාන්තය, පැදුරු විවීමේ කර්මාන්තය, ඇව කර්මාන්තය
- විවිධ කර්මාන්ත පැවතීම

  උදා : කෘෂි උපකරණ, වළං නිපදවීම, රෙදි විවීම, ආභරණ, පිත්තල බඩු නිපදවීම ආදී .....
- ශිල්පීය දක්ෂතාවය පාරම්පරිකව හිමි වීම

**(ලකුණු 03 + 03 = 06යි)**


5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




05 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 84%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 15%ක් වන අතර,අයදුම්කරුවන්ගෙන් 29%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (ii) A අනුකොටස වන අතර එහි පහසුතාව 89%කි. එසේම පහසුතාව අඩු ම කොටස (iii) වන අතර එහි පහසුතාව 31%කි.

මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලන ප්‍රදේශ, පාලනය හා සම්බන්ධ නිලධාරීන් හා මහනුවර රාජධානියේ සමාජ ආර්ථික කටයුතු පිළිබඳ ව තුලනාත්මක අවබෝධය පිරික්සීමට අදාළ ව මෙම ප්‍රශ්නය සැකසී ඇත.

මෙහි (i) කොටසට හා (iii) කොටසට පිළිවෙළින් 35% හා 31% අඩු පහසුතාව ලබා ගෙන ඇත. එම ප්‍රශ්නයේ දෙවන කොටසේ A, B, C හා D යන අනුකොටස් සඳහා පිළිවෙළින් 89%, 88%, 88% හා 52% වශයෙන් ඉහළ පහසුතා පෙන්වා ඇත. එයට හේතුව වරහන් තුළින් තෝරා ලිවීමේ දී නිවැරදි පිළිතුර තෝරාගැනීමට පහසුවීම යි.

මෙහි (iii) කොටසට 31% අඩු පහසුතාව පෙන්වීමට හේතුව වන්නේ පෙළපොතේ කරුණු විශ්ලේෂණාත්මකව සඳහන් නොවීම යි. න්‍යෂ්ටික පවුල තුළ අත්දැකීම් හා බැවහැර ඥානය නොලැබීම මෙයට හේතුවක් වී ඇත. මහනුවර රාජධානී සමයේ සමාජ කටයුතු අතර විවාහ ක්‍රම පිළිබඳ දීර්ඝ විස්තරයක් සඳහන් නොවේ. තව ද පිළිතුරු ලිවීමේ දී නූතන විවාහ චාරිත්‍ර පිළිබඳ සිසුන් වැඩි අවධානයක් යොමු කර ඇති බව අනාවරණය වේ. ඉගෙනුම් ක්‍රියාවලියේ දී පැරණි ආවාහ විවාහ ක්‍රම පිළිබඳ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

මෙම ප්‍රශ්නයේ (iv) කොටසෙහි "A" සහ "B" කොටස් සඳහා 41% හා 40% පහසුතාවක් දක්වා ඇත. මහනුවර රාජධානියේ කෘෂිකර්මය හා කර්මාන්ත පිළිබඳ වගු සටහන් සැකසීම අතිරේක කියවීම මගින් සිසු දැනුම වර්ධනය කරගැනීම, පෙළපොත පරිහරණයෙන් දැනුම වර්ධනය කිරීම මගින් සිසුන්ට ඉහළ සාධන මට්ටම් අත්කර දිය හැකි ය.

**6 ප්‍රශ්නය**

**අභිමතාර්ථය : පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජධානියේ බලය ලබා ගැනීම සඳහා බලපෑ හේතු සහ ඉංග්‍රීසින්ට එරෙහිව ඇති වූ ප්‍රථම ජාතික නිදහස් සටන පිළිබඳ දැනුම හා අවබෝධය තුලනාත්මක ව පිරික්සීම.**

**6.** (i) ඉන්දියානු සාගරය අවට රටවල වෙළෙඳ තරගයක යෙදී සිටි යුරෝපා ජාතීන් **තුනක්** (බ්‍රිතාන්‍යයන් හැර) නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ත්‍රිකුණාමල වරාය බ්‍රිතාන්‍යයන්ට වැදගත් වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව. 1815 දී වැඩි ආයාසයකින් තොරව බ්‍රිතාන්‍යයන්ට උඩරට යටත් කර ගැනීමට හැකිවූයේ ඇයි දැයි කරුණු **දෙකක්** යටතේ පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) උඩරට යටත් කර ගැනීමෙන් වසර තුනක් පමණ කාලයක් ගත වන විට, ජාතික නිදහස් සටන් ව්‍යාපාරයක් ආරම්භ වීමට තුඩු දුන් හේතු **තුනක්** දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**6. (i) (a)** - පෘතුගීසි / පෘතුගීසීන්

- ඕලන්ද/ ලන්දේසි / ලන්දේසීන්
- ප්‍රංශ / ප්‍රංශවරු / ප්‍රංශයින්

**(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** - ත්‍රිකුණාමලය වරාය, බෙංගාල බොක්කට මුහුණ ලා පිහිටා තිබීම.

- ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය ''ප්‍රංශ ජාතිකයින්ගෙන්' රැක ගැනීමට එම වරායේ පිහිටීම වැදගත් වීම.
- ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමලය වරාය යොදා ගත හැකි වීම.
- නාවික ශක්තිය ආරක්ෂා කිරීම
- නැව් අලුත්වැඩියාව **(ලකුණු 02 × 02 = 04යි)**

**(iii)** - ජෝන් ඩොයිලිගේ උපක්‍රමශීලි ක්‍රියා කලාපය


- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කෙරෙහි උඩරට රදළ, භික්ෂූන් හා සාමාන්‍ය ජනතාව තුළ ඇති වූ අප්‍රසාදය
- මේ වනවිට උඩරට භෞතික පරිසරය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඉංග්‍රීසීන් සතුව පැවතීම
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අදූරදර්ශී ක්‍රියා කලාපය
- ඉංග්‍රීසීන්ගේ හමුදා ශක්තිය
- ඇතැම් රදළවරුන් ඉංග්‍රීසීන්ට පක්ෂපාති වීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** - නිදහස අහිමිවීම හා රජෙකුගේ නැතිවීම පිළිබඳ පසුතැවිල්ල

- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම
- බහුතර සිංහල පිරිසක් සිටි ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ මුහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් නැමැත්තා පත් කිරීම
- 1815 ගිවිසුම් ප්‍රකාර කටයුතු නොකිරීම **(ලකුණු 03 + 03 = 06යි)**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





06 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 80%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 04 | ප්‍රාන්තරයේ | 29%ක් ද |
| ලකුණු | 05 - 09 | ප්‍රාන්තරයේ | 28%ක් ද |
| ලකුණු | 10 - 13 | ප්‍රාන්තරයේ | 18%ක් ද |
| ලකුණු | 14 - 18 | ප්‍රාන්තරයේ | 25%ක් ද |

ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 25%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 29%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වන අතර එහි පහසුතාව 62%කි. එසේම පහසුතාව අඩු ම කොටස (iv) වන අතර එහි පහසුතාව 41%කි.

පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් අතුරෙන් බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජධානියේ බලය ලබා ගැනීම සඳහා බලපෑ හේතු සහ ඔවුන්ට එරෙහිව ඇති වූ ප්‍රථම ජාතික නිදහස් සටන පිළිබඳ දැනුම හා අවබෝධය තුලනාත්මක පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් කර ඇත.

මෙහි (i) (ii) කොටස්වලට සිසුන් ඉහළ පහසුතා ලබාගෙන ඇති අතර එය පිළිවෙළින් 62% හා 61% වශයෙන් වේ. 41% අඩු ම පහසුතාව ලබා ඇත්තේ (iv) කොටසට ය. මෙම ප්‍රශ්නයේ සෑම කොටසක ම පහසුතාව 40% ඉක්මවා ඇත. තෝරාගැනීමද 80%ක් තරම් ඉහළ මට්ටමක පවතී. කාලානුරූපව ශ්‍රී ලංකාවට පැමිණි විවිධ යුරෝපා ජාතීන් හා බැඳුණු සංසිද්ධි කතාන්දර ලෙස ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය සඳහා ගුරුභවතුන්ට පන්තිකාමරයේ දී භාවිත කළ හැකි ය. මෙම පාඩමට අදාළ ව වගු සටහන් මගින් තොරතුරු බිත්ති පුවත්පත්වල ප්‍රදර්ශනය කිරීමෙන් පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමෙන් ඉහළ සාධන මට්ටමක් ළඟා කරගත හැකි ය.

විවිධ ක්‍රමවලට සැකසූ ප්‍රශ්න මගින් සිසුන් තුළ අවබෝධය තහවුරු කර ගැනීමට යොමු කිරීම තුළින් මෙම පහසුතාව තවත් වර්ධනය කර ගත හැකි ය. වාද විවාද, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතය, නාට්‍යානුසාරයෙන් රඟදැක්වීම යන ක්‍රම මගින් මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගත හැකි ය.

**7 ප්‍රශ්නය**

**අභිමතාර්ථය : ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලින් පසුව ඇති වූ සංවර්ධන ව්‍යාපාර ඇති කිරීමේ අරමුණු සහ වියළි කලාපීය කෘෂිකාර්මික සංවර්ධනය ද, බහුකාර්ය යෝජනා ක්‍රමයක් වශයෙන් මහවැලි ගඟ යොදා ගැනීමේ සුවිශේෂත්වය තුලනාත්මකව පිරික්සීම**

**7.** (i) ශ්‍රී ලංකාවේ

*A* - නායකයන්ට කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ තීරණ ගැනීමට අවස්ථාව ලැබුණු මුල්ම ආණ්ඩු ක්‍රමය ද

*B* - ගොවි ජනපද ව්‍යාපාරයේ පියා වශයෙන් සැලකෙන ජන නායකයා ද

*C* - ආරම්භ කරන ලද ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය ද

පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගොවි ජනපද ව්‍යාපාර ඇති කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාර සඳහා ඉතාමත් සුදුසු වන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපය බව කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) "බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් ගංගාවලට වඩා මහවැලි ගඟ විශේෂත්වයක් උසුලයි." මේ බව කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**7. (i)** *A* - ඩොනමෝර් ආණ්ඩුක්‍රමය / 1931 ආණ්ඩුක්‍රමය

*B* - ඩී.එස්. සේනානායක මහතා

*C* - ගල්ඔය **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** - තෙත් කලාපයේ ඉහළ යමින් පවතින ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම

- රටේ ආහාර නිෂ්පාදනය වැඩිකිරීම
- වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අලුත්වැඩියා කොට එහි ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම
- තෙත් කලාපයේ පවතින ඉඩම් හිඟයට පිළියමක් වීම **(ලකුණු 02 + 02 = 04යි)**


**(iii)** - වියළි කලාපයේ ජන හීන තැනිතලා බිම් බහුල වීම.

- වී ගොවිතැනට සුදුසු දේශගුණයක් හා සරුපසක් තිබීම.
- ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු පැරණි වැව් අමුණු බහුල ප්‍රදේශයක් වීම.
- නව වාරිමාර්ග තැනීමට සුදුසු භෞතික පරිසරයක් දක්නට ලැබීම. **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** - පුළුල් තැනිතලා ප්‍රදේශයක් හා ජනහීන ප්‍රදේශයක් හරහා ගලා බැසීම.
(උදා : මහියංගනය - ත්‍රිකුණාමලය)

- අතු ගංගා රාශියකින් යුක්ත වීම.
- මෙම අතු ගංගා නිරිත, ඊසාන මෝසම් හා සංවහන වැසි මගින් පෝෂණය වීම.
- ගඟේ ඉහළ කොටස විදුලි බල උත්පාදනය සඳහා සුදුසු වීම.
- සංවර්ධනය කළ හැකි පැරණි ඇළ මාර්ග රාශියක් මහවැලි ගඟ හා සම්බන්ධව තිබීම.
(උදා : මිණිපේ, ඇළහැර. අංග මැඩිල්ල, පබ්බතන්ත හා කාලිංග යෝධ ඇළ)
- වී ගොවිතැනට සුදුසු දේශගුණයක් තිබීම
- වී ගොවිතැනට සුදුසු සරුපසක් තිබීම **(ලකුණු 03 + 03 = 06යි)**


7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 29%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 41%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10% වන අතර, 41% ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් සාධනය වැඩි ම අනුකොටස (ii) වන අතර එහි ප්‍රතිශතය 47%කි. සාධනය අඩු ම කොටස (i) C වන අතර එහි සාධනීය මට්ටම 26%කි.

ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලින් පසුව ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපාර ඇති කිරීමේ අරමුණු, වියළි කලාපීය කෘෂිකාර්මික සංවර්ධනය සහ බහුකාර්ය යෝජනා ක්‍රමයක් වශයෙන් මහවැලි ගඟ යොදා ගැනීමේ සුවිශේෂිතාව තුලනාත්මකව පිරික්සීම මෙම ප්‍රශ්නය මඟින් සිදු වේ.

මෙම ප්‍රශ්නයේ (ii) කොටසට 47% පහසුතාවක් ද, අනෙක් සියලු ම අනුකොටස් සඳහා ඊට අඩු පහසුතාවක් ද දක්වා ඇත. ඒ අතර අවම පහසුතාව (i) C අනුකොටසට හිමි වී ඇති අතර, එහි ප්‍රතිශතය 26%කි. එම ප්‍රශ්නයට අදාළ විෂයය සංදර්භය භූගෝල විද්‍යාව කාණ්ඩ විෂයයෙන් ද පෝෂණය වේ. මෙම කාණ්ඩ විෂය සියලු ම දරුවන් තෝරා නොගත්ත ද 9 ශ්‍රේණිය දක්වා උගත් විෂය කරුණු වඩාත් ඵලදායී ලෙස උපකාර කර ගත හැකි ය. සිසුන් මෙම ප්‍රශ්නය තෝරා ගැනීම පිළිබඳ ව වැඩි සැලකිල්ලක් නොදැක්වීමටත්, තෝරා ගත් පිරිස වුවද අඩු පහසුතාවක් දැක්වීමටත් හේතු වී ඇත්තේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානයේ දී ගුරුභවතුන් පෙළපොතෙහි පාඩම් ඒකක තුළ සපයා ඇති සිතියම් පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකිරීම යි.

සමස්තයක් ලෙස සිසුන් මෙම ප්‍රශ්නය තෝරගැනීමේ තරමක අඩු බවක් පෙන්නුම් කරයි. නිදහසින් පසු සංවර්ධන කටයුතු පිළිබඳ සමස්ත විෂයය තුළ අඩු අවධානයක් යොමුවීම ද එයට එක් හේතුවක් විය හැක. මෙයට පිළියමක් ලෙස සිසුන් ක්ෂේත්‍ර චාරිකා සඳහා යොමු කිරීම, ස්වනිර්මාණ ඉදිරිපත් කිරීම, සිතියම් ලකුණු කිරීම, පින්තූර එකතුවක් පවත්වා ගැනීම වැනි ගෝචර ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. ඒ තුළින් සිසු දැනුම ආකල්ප වර්ධනය කර ඉහළ සාධන මට්ටමක් ළඟා කර දිය හැකි ය.

## III කොටස

**8 ප්‍රශ්නය**

**අභිමතාර්ථය : යුරෝපයේ ඇති වූ පුනරුදය විද්‍යාත්මක හා කලා ශිල්ප කෙරෙහි ඇති කරන ලද බලපෑම හා දේශ ගවේෂණය නිසා ඇති වූ ප්‍රතිඵල පිළිබඳ දැනුම, අවබෝධය පිරික්සීම**

**8.** (i) පුනරුදය නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - පෘථිවිය ගෝලාකාර බව සොයාගැනීම

*B* - දුරේක්ෂය නිපදවීම

*C* - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

*D* - මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) *A* - මානව වාදය යන්නෙන් කුමක් අදහස් කෙරේ ද?

*B* - පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් චිත්‍ර නිර්මාණ **තුනක්** නම් කරන්න. (ලකුණු 05 යි)

(iv) දේශ ගවේෂණයේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**8. (i)** - ෆ්ලෝරන්ස්, වැනීසිය, ජිනෝවා, රෝමය **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - නිකලස් කොපර්නිකස්

*B* - ගැලීලියෝ ගැලිලි

*C* - සර් අයිසෙක් නිවුටන්

*D* - ජොහැන්නස් ගුටන්බර්ග් **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** *A* - මිනිසා උතුම් කොට සැලකීම

*B* - මොනාලිසා


- අවසාන විනිශ්චය
- අන්තිම භෝජන සංග්‍රහය
- ආදම්ගේ චිත්‍රය
- දේව දරුවන් දෙදෙනාගේ චිත්‍රය **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** - නව රටවල් සොයා ගැනීම

(උදා : පිලිපීනය, කැනඩාව, බටහිර, ඉන්දීය දූපත් ආදි .......)

- නව වෙළෙඳ මාර්ග සොයා ගැනීමත් සමග වෙළෙඳ කටයුතු ව්‍යාප්ත වීම
- යටත් විජිතවාදය ආරම්භ වීම
- යුරෝපා චින්තනය ලොව පුරා පැතිර යාම
- ආසියා, අප්‍රිකා රටවල යුරෝපා බල ව්‍යාප්තිය
- ලෝකය ගෝලාකාර බව තහවුරු වීම
- යුරෝපා චින්තනය හා යුරෝපා සංස්කෘතිය ලොවපුරා පැතිර යාම
- ආගම ප්‍රචාරය කිරීම **(ලකුණු 03 + 03 = 06යි)**


8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




08 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 77%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 19%ක් වන අතර, 30%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් 8 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (ii) B අනුකොටස වන අතර එහි පහසුතාව 87%කි. එසේම පහසුතාව අඩු ම කොටස (i) වන අතර එහි පහසුතාව 31%කි.

යුරෝපයේ ඇති වූ පුනරුදය විද්‍යාත්මක හා කලා ශිල්ප කෙරෙහි ඇති කරන ලද බලපෑම හා දේශ ගවේෂණය නිසා ඇති වූ ප්‍රතිඵල පිළිබඳ දැනුම, අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරයි.

මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව දක්වා ඇත්තේ (ii) හි B හා C අනුකොටස් වන අතර, එහි පහසුතාව පිළිවෙළින් 87% හා 85% වේ. 31% අවම ප්‍රතිශතයක් පෙන්වා ඇත්තේ ප්‍රශ්නයේ (i) කොටස සඳහා ය.

සමස්තයක් ලෙස ලෝක ඉතිහාසය තුළ මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 77%කි. මෙයට හේතුව ඉතිහාසයේ 8 ශ්‍රේණියේ විෂය නිර්දේශය තුළ පුනරුදය තේමාව සැකෙවින් විස්තර කිරීමයි. මෙම විෂය කරුණු 10 ශ්‍රේණියේ දී නැවත ආවරණය වීම ඉහළ පහසුතාව පෙන්වීමට හේතුවකි. පුනරුදයෙන් ප්‍රසිද්ධියට පත් නගර පිළිබඳ ව සිසු අවධානය යොමු කිරීම සඳහා සිතියම් අධ්‍යයනය තුළින් ඒවා පිහිටි ඉතාලියානු ප්‍රදේශ පිළිබඳ ව සිසුන්ගේ දැනුවත්භාවය සංවර්ධනය කිරීම සුදුසුය.

සිතියම් ලකුණු කිරීම, ලෝක ඉතිහාස ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, කථික තරඟ, බුද්ධි ප්‍රබෝධ වැඩසටහන් සංවිධානය කිරීම තුළින් ඉහළ සාධනයක් ළඟා කර ගත හැකි ය.

### 9 ප්‍රශ්නය

**අභිමතාර්ථය : යුරෝපා ජාතීන් අමරිකාවේ ජනපද පිහිටුවීම ද, ලෝකයේ කැපිපෙනෙන විප්ලවවලට බලපෑ හේතු සහ ඒවායේ ප්‍රතිඵල ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය හා අවබෝධය තුලනාත්මකව අවබෝධ කර ගැනීමේ හැකියාව**

**9.** (i) ඇමෙරිකාවේ ජනපද පිහිට වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඇමෙරිකානු විප්ලවයට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවයේ ප්‍රතිඵල නිසා ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)


**9. (i)** - පෘතුගිසි, ඕලන්ද (ලන්දේසීන්), ප්‍රංශ, ඉංග්‍රීසි (බ්‍රිතාන්‍යයන්). ස්පාඤ්ඤ **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)**
- බ්‍රිතාන්‍යය අනුගමනය කළ තම රටට වාසිදායක ආර්ථික ප්‍රතිපත්තිය
- ජනපදවාසීන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප බ්‍රිතාන්‍ය පාලකයන් විසින් නිසි ලෙස අවබෝධ කර ගෙන නොසිටීම
- ජනපදවාසීන්ගේ සාධාරණ සටන් මර්දනය කිරීමට බ්‍රිතාන්‍ය කටයුතු කිරීම
- 1763න් පසුව පැනවූ අණ පනත් හා නව බදු වර්ග
- නිදහස පිළිබඳ ජනපද වැසියන් තුළ ඇති වූ උනන්දුව **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- රජුගේ හා රජ පවුලේ අධික වියදම්
- අනවශ්‍ය යුධ වියදම්
- අසාධාරණ බදු (උදා : ටේල්, ගැබෙල්, කැපිටේෂන්) **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)**
- සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම
- සමාජවාදී රාජ්‍යයන් බිහි වීම
  උදා : (චීනය, උතුරු කොරියාව, නැගෙනහිර ජර්මනිය, කියුබාව)
- රුසියාව මුල් කර ගත් සමාජවාදී කඳවුරක් බිහි වීම
- දිගුකාලීන ප්‍රතිඵලයක් ලෙස නොබැඳි ජාතීන් බිහිවීම **(ලකුණු 03 + 03 = 06යි)**


**9 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




09 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 20%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර, 42%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.





★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් 4 අතුරෙන් පහසුතාව වැඩි ම කොටස (i) වන අතර එහි පහසුතාව 57%කි. එසේම පහසුතාව අඩු ම කොටස (iv) වන අතර එහි පහසුතාව 19%කි.

යුරෝපා ජාතීන් ඇමරිකාවේ ජනපද පිහිටුවීම, ලෝකයේ කැපී පෙනෙන විප්ලවවලට බලපෑ හේතු හා එම විප්ලවවල ප්‍රතිඵල ලෝක දේශපාලනය කෙරෙහි බලපෑ ආකාරය තුලනාත්මකව අවබෝධ කරගෙන ඇති ආකාරය විශ්ලේෂණය කිරීම මෙමගින් සිදු වේ.

මෙහි දී වැඩි පහසුතාවක් ලබාගෙන ඇත්තේ (i) කොටස වන අතර එය 57%කි. 19% වන අඩු පහසුතාව (iv) කොටසට ලබා ගෙන ඇත. සමස්ත ප්‍රශ්න පත්‍රය තුළ මෙන්ම ලෝක ඉතිහාසය කොටසේ ද අඩු ම සිසුන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නයේ කොටස් අනුකොටස් ලෙස බෙදා නැත. ඇමෙරිකානු නිදහස් සටන, ප්‍රංශ විප්ලවය හා රුසියානු විප්ලවය සම්බන්ධ තොරතුරු පහළ ශ්‍රේණිවල ඉතිහාසය විෂයය තුළින් ආවරණය නොවන නිසා ගුරුභවතුන් ගුරු අත්පොත හා පෙළ පොත පරිශීලනය කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු ගෝචර වන ලෙස සකස් කර ගත යුතු ය. ඒ තුළින් සිසු අවධානය ලෝකයේ කැපී පෙනෙන විප්ලව කෙරෙහි යොමු කර ගත හැකි ය. මෙම තේමාවට අදාළ ව අතිරේක කියවීම් භාවිතය, පෙළපොතේ තොරතුරු මනා ලෙස පරිශිලනය, ඒවා වගුගත කිරීම, සංසන්දනය කිරීම, ක්ෂේත්‍ර පොත් සකස් කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් සිසුන්ගේ සාධන මට්ටම වර්ධනය කරගත හැකි ය. තව ද අන්තර්ජාලය හා නව තාක්ෂණයේ ක්‍රමෝපායන් මගින් තොරතුරු සෙවීමේ ක්‍රියාමාර්ගවලට සිසුන් යොමු කිරීම ඵලදායී වේ.

## 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




## I කොටස

අනිවාර්ය ප්‍රශ්නයක් වන පළමුවන ප්‍රශ්නය I කොටසට අයත් වේ. මෙම ප්‍රශ්නය සකස් වී ඇත්තේ (අ) (i), (ii), (ආ) (i), (ii) හා (iii) යන අනුකොටස්වලිනි. මෙම ප්‍රශ්නයට ලකුණු 30ක් හිමි වේ. ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ වන්නේ (අ) (i), (ආ) A, (ආ) (ii) කොටස හා (ආ) (iii) යන කොටස් වේ. ලෝක ඉතිහාසය කොටසට අයත් වන්නේ (අ) (ii) හා (ආ) (i) B, C සහ D යන අනුකොටස්ය.

ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි ශ්‍රී ලංකා සිතියම ලකුණු කිරීමේ පහසුතාව 33% වන අතර, ලෝක සිතියම ලකුණු කිරීමේ පහසුතාව 26% වේ. සිතියම් ලකුණු කිරීමේ දී සිතියම් කරණයේ මූලික සිද්ධාන්ත පිළිබඳ අවබෝධය අඩුකමත්, ඒ සඳහා ශිෂ්‍ය අවධානය යොමු නොවීමත්, නිශ්චිතව ස්ථාන හඳුනාගෙන නම් නොකිරීමත් මෙහි දී දක්නට ලැබෙන පොදු දුර්වලතා වේ. සිතියම් ලකුණු කර නම් කිරීමේ අභ්‍යාසවල යෙදවීම, එම ස්ථානවල පිහිටීම භෞතික ලක්ෂණ හා සම්බන්ධ කොට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රයෝජනය ගැනීම, නිරන්තර අවධානයට යොමුවන ලෙස සිතියම් පංති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීම, කේවල ව්‍යාපෘති ලෙස සිතියම් ලකුණු කිරීමට සිසුන් යොමු කිරීම තුළින් සිසු සාධන මට්ටම ඉහළ නංවාගත හැකි ය.

(ආ) (i) කොටසට අයත් වන්නේ A, B, C හා D වශයෙන් පිළිතුරු ලිවීමට ඇති කෙටි ප්‍රශ්න 4කි. පිළිවෙළින් එහි පහසුතාව 41%, 43%, 29% හා 29% වේ. එහි ශ්‍රී ලංකා ඉතිහාසයට සම්බන්ධ එක් ප්‍රශ්නයක් ද, ඉතිරි අනුකොටස් තුන ලෝක ඉතිහාසයෙන් ද ලබා දී ඇත. දැනුම හා සම්බන්ධ වන මෙම කොටස්වල සිසු අවබෝධය වර්ධනය කිරීම සඳහා පෙළපොත පරිශීලනය, පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීම, කෙටි ප්‍රශ්න සැකසීම හා පිළිතුරු ලිවීම පන්ති මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම උපකාරීවනු ඇත.

පළමු ප්‍රශ්නයේ (ආ) (ii), (iii) කොටස්වලින් A හා B වශයෙන් රූප අධ්‍යයනයට යොමු කර ඇත. එහි දී එම රූපය සඳහා තෝරාගෙන ඇත්තේ ශ්‍රී ලංකා ඉතිහාසයේ 10 ශ්‍රේණියේ පෙළපොතේ ඉසුරුමුණි විහාරයේ ඇති ප්‍රසිද්ධ කලාකෘතියකි. මෙහි කලා ඉතිහාසය හා ඉන් නිරූපණය වන සංකල්පය පිළිබඳ සිසුන්ගේ අවධානය යොමුකොට ඇත. මෙහි දී කලාකෘතිය හඳුනාගැනීමේ 82% පහසුතාවක් පෙන්වා ඇත්තේ පහළ ශ්‍රේණිවල දී සමෝධානික ලෙස විෂය කරුණු ආවරණය වන බැවිනි.

පළමු ප්‍රශ්නයේ (ආ) (iii) කොටසට ශ්‍රී ලංකා ඉතිහාසයට සම්බන්ධ රොබට් නොක්ස් විසින් අඳින ලද දෙවන රාජසිංහ රජුගේ රූපය දක්වා ඇත. එහි දී එතුමා අයත් රාජධානිය පිළිබඳ ප්‍රශ්නයට 76% ඉහළ මට්ටමක් පෙන්වා ඇත. මහනුවර රාජධානිය තුළ කැපී පෙනෙන රජෙකු ලෙස සිසුන් තුළ එතුමා පිළිබඳ අවබෝධය හා දැනුම පහළ ශ්‍රේණිවල දී ද ලබා තිබීම මෙම පහසුතාවට හේතු වී ඇත.

## II කොටස

ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ මෙම කොටසේ පහසුතාව 45%කි. මෙම කොටසේ ප්‍රශ්න 06ක් ඇත. ඉන් ප්‍රශ්න 4කට පිළිතුරු සැපයිය යුතු ය. ප්‍රශ්න තෝරා ගැනීම 2 සිට 7 දක්වා පිළිවෙළින් 2 - 94%, 3 - 87%, 4 - 25%, 5 - 84%, 6 - 80% සහ 7 - 29% වශයෙනි.

දෙවන ප්‍රශ්නයෙන් විමසා බැලෙනුයේ ශ්‍රී ලංකාව ජනාවාස වීම, මුල් මානවයා ජීවත් වූ පරිසරය, පූර්ව ඓතිහාසික හා මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ ජනතාවගේ ජීවන රටාව පිළිබඳවයි. මෙම ප්‍රශ්නය සඳහා ඉහළ පහසුතාව ළඟා කර ගැනීමට හේතු වී ඇත්තේ 6 ශ්‍රේණියේ සිටම මෙම විෂය කරුණු අධ්‍යයනය කිරීමට අවස්ථාව හිමිවීමයි.

5 වන ප්‍රශ්නයේ (ii) අනුකොටසෙහි A, B හා C ප්‍රශ්න සඳහා පිළිවෙළින් 89%, 88% හා 88% වශයෙන් ඉහළ පහසුතා මට්ටමක් ලබා තිබීම කැපී පෙනේ. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා ගැනීමට අවස්ථාව ලැබීම ඊට එක් හේතුවක් විය හැක.

මෙම කොටසින් අඩුම තෝරා ගැනීම් දක්නට ලැබෙන්නේ 4 හා 7 වන ප්‍රශ්නවලට ය. 4 වන ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණයේ පාලන මධ්‍යස්ථාන බිහිවීම පිළිබඳ ව ද 7 වන ප්‍රශ්නය මඟින් ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලින් ඇති වූ සංවර්ධන පිළිබඳ ව ද පිරික්සනු ලබයි. 4වන ප්‍රශ්නයට අදාළ විෂය කොටස 10 ශ්‍රේණියේ දී පමණක් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබීම හා එම විෂය කරුණු සංකීර්ණ වීම අඩු පහසුතාවට හේතු වූවා විය හැකි ය.

7 වන ප්‍රශ්නය සකස් වී ඇත්තේ 11 ශ්‍රේණියේ පෙළ පොතේ ''නිදහසින් පසු ශ්‍රී ලංකාව'' යන මාතෘකාව යටතේ ය. මෙහි සඳහන් විෂයය කරුණු සිසුන් නිරවුල් ව අවබෝධ කරගෙන ඇති බවක් නොපෙනේ. එමනිසා එම ප්‍රශ්නයේ අඩු සාධනයක් පෙන්නුම් කරයි.

ඉතිහාසය විෂය කරුණු ඉගැන්වීමේ දී වඩා නිරවුල් ලෙස සිසුන්ට අවබෝධ කරවීම සඳහා විවිධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම හා ප්‍රියජනක පන්ති කාමර වාතාවරණයක් ගොඩ නැංවීම කෙරෙහි අවධානය යොමු විය යුතු ය. විශේෂයෙන් සංකල්ප සිතියම්, වගු සටහන්, සැසඳුම් පත්‍ර, බුද්ධි මණ්ඩල සාකච්ඡා, භූමිකා රංගන, අතිරේක කියවීම් සඳහා යොමු කිරීම, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිත කිරීම, ක්ෂේත්‍ර චාරිකා තුළින් ප්‍රායෝගික අධ්‍යයනයට අවස්ථා සැලසීම මගින් ඉහළ සාධන මට්ටමක් ළඟා කර ගත හැකි ය.

## III කොටස

III කොටසට අයත් වන්නේ ලෝක ඉතිහාසයයි. මෙයට අයත් වන්නේ ප්‍රශ්න අංක 08 හා 09 යන ප්‍රශ්න දෙක වන අතර එහි තෝරාගැනීමේ ප්‍රතිශතය පිළිවෙළින් 77% හා 20% වේ.

8 වන ප්‍රශ්නය සඳහා පිළිතුරු ලිවීමේ වැඩිම පහසුතා දක්වා ඇත්තේ II කොටසේ B හා C අනුකොටස් සඳහා ය. එහි පහසුතා පිළිවෙළින් 87% හා 85% වැනි ඉහළ මට්ටමක පවතී. මෙම ප්‍රශ්නයෙන් විමසා බලනුයේ යුරෝපයේ ඇති වූ පුනරුදයේ විද්‍යා, කලා ශිල්ප, දේශගවේෂණය ආදියෙහි සිදු වූ පරිවර්තනයයි. මෙහි දී දැනුම, අවබෝධය හා විශ්ලේෂණ හැකියාව යන අංශ කෙරෙහි අවධානය යොමු වී ඇති අතර ඒ පිළිබඳ ව ඇති සිසු දැනුම හා අවබෝධය සතුටුදායක මට්ටමක පැවතීම හේතුවෙන් තෝරා ගැනීම ඉහළ මට්ටමක පවතී.

9 වන ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 20%කි. මෙම ප්‍රශ්නය සකස් වී ඇත්තේ ලෝකයේ කැපී පෙනෙන විප්ලව තේමාව ඇසුරෙනි. ප්‍රශ්නය තුළින් ශිෂ්‍යයාට උත්තේජිත පෙළඹවීමක් නොකරන හෙයින් මෙය ජනප්‍රියතාවයෙන් අඩු වූවා විය හැකි ය. තව ද, ඇමරිකානු, ප්‍රංශ, රුසියානු විප්ලව පිළිබඳ වෙනත් ශ්‍රේණිවල දී අධ්‍යයනය කිරීමට අවස්ථාවක් නොමැති නිසා ඒ පිළිබඳ ව ඇති දැනුම හා අවබෝධය අවම මට්ටමක පැවතීම ප්‍රශ්නය තෝරා ගැනීම අවම වීමට හේතු වූවා විය හැක. එම ප්‍රශ්නයේ පළමු කොටස 57% පහසුතාව දක්වා ඇත. මෙහි අඩුම පහසුතාව දක්වා ඇත්තේ (iv) වන කොටසට ය. එහි පහසුතාව 19%කි. පෙළපොත පරිශීලනය, අතිරේක කියැවීම්වලට යොමු කිරීම, ලෝක ඉතිහාසය සම්බන්ධ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සිසු අවබෝධය වර්ධනය කළ හැකි ය.

## III කොටස

**3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ ප්‍රශ්න අංක, කොටස් අංක හා අනුකොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ★ II පත්‍රයේ එකිනෙක කොටස්වලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතුය.

**විශේෂ උපදෙස් :**

- ★ සිතියම් ලකුණු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :
  - ● නගර ලකුණු කිරීමේ දී නිවැරදි ස්ථානය පැහැදිලිව තිත් ලකුණක් යොදා ලකුණු කර නම් කිරීම
  - ● වැව් ලකුණු කිරීමේ දී නිවැරදි වැව තෝරාගෙන මායිම් තුළ ප්‍රදේශය අඳුරු කර නම් කිරීම
  - ● ගංගා සහ කඳුවැටි ලකුණු කිරීමේ දී නිවැරදිව හඳුනාගත හැකිවන ලෙස නම් කිරීම
- ★ අසා ඇති ප්‍රශ්නවලට උචිත පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීම
- ★ කරුණු දැක්වීම හා ඒවා පැහැදිලි කිරීම, විස්තර කිරීම හෝ සනාථ කිරීම අනුව ප්‍රශ්නවල ලකුණු බර තබා ඇති බව තේරුම් ගැනීම
- ★ ව්‍යුහගත රචනා වර්ගයේදී නිදසුන් හා සාධක ඉදිරිපත් කළ යුතු වීම
- ★ පිළිතුරු ලිවීමේ දී ඇගයීමේ පහසුව සඳහා අවශ්‍යතැන් හි ඡේද වෙන් කළ යුතු වීම
- ★ අනුපිළිවෙළින් පිළිතුරු නම් කිරීම කළ යුතු අවස්ථාවලදී ඒ සඳහා සැලකිලිමත් වීම
- ★ වැඩිපුර දී ඇති විනාඩි 10 තුළ දී ප්‍රශ්න පත්‍රය මනා අවබෝධයකින් කියවා පිළිතුරු සැපයිය හැකි පහසු ප්‍රශ්න තෝරාගත යුතු ය. එසේ තෝරා ගැනීමේ දී ප්‍රශ්නයේ සියලු ම කොටස්වලට පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්න තෝරාගැනීම අතිශයින්ම වැදගත් වේ.

**විදුහල්පතිවරුන් උදෙසා උපදෙස් :**

- ★ විෂය සංවර්ධනය සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මගපෙන්වීම හා අනුග්‍රහය තවදුරටත් පුළුල් අයුරින් ලබා දිය යුතු ය.
- ★ විෂය සංවර්ධනය සඳහා අභ්‍යන්තර ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය යාවත්කාලීනව සැලසුම් කර සංවිධානාත්මකව පවත්වාගෙන යා යුතු ය.
- ★ ගුරුවරුන්ගේ විෂය සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප හා අමාත්‍යාංශ මට්ටමින් පවත්වන වැඩමුළු සඳහා සෑම ගුරුභවතකු ම සහභාගී කරවීමට කාරුණික විය යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.
- ★ කාලසටහන් ලබා දීමේ දී විෂය ප්‍රවීණතාවය සහිත ගුරුභවතුන්ට මූලිකත්වය ලබා දීම අත්‍යාවශ්‍ය ය.
- ★ ගුරුභවතුන්ට තම විෂය පිළිබඳ වගකීම පැවරෙන පරිදි විෂය මාලාව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දීම. (එක් ශිෂ්‍ය කණ්ඩායමක් වසර කීපයක් එක් ගුරුභවතකුගේ විෂය භාරකාරත්වයට සම්බන්ධ කිරීම)
- ★ වාර්ෂිකව ත්‍යාග, සහතිකපත් ලබා දීම වැනි ඇගයීම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය තවදුරටත් යොමු කරවීම
- ★ ඉතිහාසය විෂය සංවර්ධනය සඳහා පාසලේ පවතින සම්පත්වලට ගැළපෙන පරිදි ස්ථානයක්, උපකරණ, ආශ්‍රිත ග්‍රන්ථ, සිතියම් ලබා දීම ආදි අවශ්‍ය පියවර ගැනීමට තවදුරටත් කාරුණික විය යුතු ය.
- ★ විවිධ විෂයයන් සඳහා පුහුණුව හෝ පත්වීම් ලැබූ ගුරුභවතුන්ගේ කාල සටහන සම්පූර්ණ කිරීමේ අපේක්ෂාවෙන් ඉතිහාසය විෂය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් සඳහා යොමු නොකළ යුතු ය. එය විෂයට මෙන්ම සිසුන්ට ද කරන බලවත් හානියකි.

**විෂයභාර ගුරුභවතුන්ට උපදෙස් :**

- ★ අ.පො.ස.(සා.පෙළ)ට නියමිත විෂය නිර්දේශය ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරමින් එය ද ඉගෙනුම් උපකරණයක් වශයෙන් භාවිත කිරීමට වඩාත් අවධානය යොමු කරවීම.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ නිපුණතාවයන්ට හා විෂය සන්ධාරයට අදාළ යෝග්‍යතම ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගත යුතු ය.
- ★ හැකිතාක් දුරට ඉගෙනුම් ආධාරක තුළින් සංකල්ප සාධනයට අවස්ථා සලසා දිය යුතු ය.
- ★ අ.පො.ස.(සා.පෙළ) විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් සකස් කොට ඇති ඇගයීම් වාර්තා පරිශීලනය කොට එය විෂය සංවර්ධනය සඳහා යොදා ගත යුතු ය.
- ★ අඩු සාධන මට්ටම් පෙන්නුම් කෙරෙන විෂය කොටස් සඳහා සාධන මට්ටම සංවර්ධනය කිරීමට විශේෂ වැඩමුළු, කඳවුරු, ව්‍යාපෘති, පැවරුම් වැනි ක්‍රියාකාරකම් යොදා ගත හැකිය.
- ★ මාසික පරීක්ෂණ, වාර පරීක්ෂණ, පාසල් පාදක ඇගයීම් වැනි ක්‍රියාකාරකම් තුළින් සිසුන්ගේ සාධන මට්ටම් හඳුනාගෙන විෂය සංවර්ධන සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

**ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළයුතු යෝජනා :**

- සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකගේ ම සාධන මට්ටම පිළිබඳ ව පෞද්ගලික අවධානය යොමු කිරීම
- ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
- විෂය ක්‍රියාකාරකම් ප්‍රබෝධාත්මක අයුරින් සංවිධානය කිරීම
- සැලසුම් කරන ලද ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම
- විශේෂයෙන්ම පෙළපොත පරිහරණය සඳහා උනන්දු කරවීම
- සිසු නිර්මාණ (විෂයයට අදාළ) පන්තියේ ප්‍රදර්ශනය කිරීම (බිත්ති පුවත්පත්, සඟරා, ප්‍රහේලිකා, කෙටි ප්‍රශ්න හා පිළිතුරු සංග්‍රහ සකස් කිරීම)
- ඉතිහාසය විෂයය සඳහා ඒකකයක් වෙන් කර සංවර්ධනය කිරීම
- පාසල් පරිසරය ඉතිහාස විෂයයේ ඉගෙනුම් පරිසරයක් බවට පත් කිරීම
  උදා: විවිධ ඓතිහාසික සිතියම් නිර්මාණය, වැවක ආකෘතියක් තැනීම ආදී...
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණවලට යොමුකොට කරුණු ගවේෂණය කිරීම
- ඉගෙනුම් ආධාරක වශයෙන් නිවැරදි සිතියම් භාවිත කිරීම හා සිතියම් සංග්‍රහ සකස් කරවීම
- පිළිතුරු ලිවීමේ දී කරුණු නිවැරදි ව සංවිධානය, ප්‍රගුණ කිරීමේ අභ්‍යාස කරවීම
- ගමෙහි/ ප්‍රදේශයෙහි/ රටෙහි ඓතිහාසික ස්ථාන හා සිදුවීම් ජනප්‍රවාද ඇසුරෙන් සොයා බැලීමට හා අධ්‍යයනයට යොමු කරවීම
- රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත්වල අධ්‍යාපනික වැඩසටහන් සාකච්ඡා සහ ලිපිවලින් තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.
  (නිද - මහා සංචාරේ, වන්දනා, සති අන්ත පුවත්පත්වල පළවන විශේෂ අතිරේක)
- ප්‍රවීන දේශකයන්ගේ උදව් උපකාර ලබා ගැනීම
- බුද්ධි මණ්ඩල සාකච්ඡා, විවිධ පාසල් තුළ හා පාසල් අතර සංවිධානය කිරීම
- ශිෂ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීම, නිසිලෙස පසුවිපරම් කිරීම